ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 488

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

## පස්වැනි වාර්තාව

(2024.03.19 සිට 2024.05.09 දක්වා සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා විසින්
2026 මාර්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලදී.

*2026 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

***"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."***

**<u>නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය</u>**

**<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

**<u>(වාර්තාවේ සඳහන් කාල සීමාව තුළදී)</u>**

1. ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම. (කාරක සභාවේ සභාපති)
2. ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා, පා.ම.
3. ගරු ප්‍රසන්න රණවීර මහතා, පා.ම.
4. ගරු කේ .කාදර් මස්තාන් මහතා, පා.ම.
5. ගරු ඩයනා ගමගේ මහත්මිය, පා.ම. (2024.05.08 දින දක්වා)
6. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
7. ගරු තිස්ස අත්තනායක මහතා, පා.ම.
8. ගරු වජිර අබේවර්ධන මහතා, පා.ම.
9. ගරු ඒ. එල් .එම් .අතාඋල්ලා මහතා, පා.ම.
10. ගරු ජයරත්න හේරත් මහතා, පා.ම. (2024.03.20 දින සිට)
11. ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
12. ගරු විමලවීර දිසානායක මහතා, පා.ම.
13. ගරු නිරෝෂන් පෙරේරා මහතා, පා.ම.
14. ගරු ජේ .සී .අලවතුවල මහතා, පා.ම.
15. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.
16. ගරු ජයන්ත කැටගොඩ මහතා, පා.ම.
17. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.
18. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
19. ගරු එම් .උදයකුමාර් මහතා, පා.ම.
20. ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා, පා.ම.
21. ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා, පා.ම.
22. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා, පා.ම. (2024.03.20 දින සිට)
23. ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා, පා.ම.
24. ගරු නීතිඥ ප්‍රේම්නාත් සී .දොලවත්ත මහතා, පා.ම.
25. ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය, පා.ම.
26. ගරු එම් .ඩබ්ලිව් .ඩී .සහන් ප්‍රදීප් විතාන මහතා, පා.ම.
27. ගරු නීතිඥ මධුර විතානගේ මහතා, පා.ම.
28. ගරු ඩී. වීරසිංහ මහතා, පා.ම.
29. ගරු වීරසුමන වීරසිංහ මහතා, පා.ම.
30. ගරු මංජුලා දිසානායක මහත්මිය, පා.ම.
31. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය, පා.ම.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු කබීර් හෂීම් මහතා, පා.ම. (කාරක සභාවේ සභාපති)
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම.
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම.
4. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම.
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම.
6. ගරු නලින් හේවගේ මහතා, පා.ම.
7. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම.
8. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම.,
9. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
10. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
11. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.
12. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
13. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
14. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
15. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
16. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම.
17. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
18. ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම.
19. ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම.
20. ගරු අජන්ත ගම්මැදගේ මහතා, පා.ම.
21. ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම.
22. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
23. ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම.
24. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා, පා.ම.
25. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
26. ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම.
27. ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
28. ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
29. ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම.

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය</u>**

- සනත් විජේගුණවර්ධන මයා - කාරක සභා ලේකම්/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
- චමීලා රූපසිංහ මහත්මිය - ප්‍රධාන නිලධාරි
- ආර්. ඒ. ඩී. එන්. ගියෝවනී මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- ජේ. ටී. එල්. පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරි
- ජී. ඩී. ජේ. එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරි
- ජී. එම්. කල්ලැගොඩ මහත්මිය - පාර්ලිමේන්තු නිලධාරි
- එම්.එල්.ඒ.ඩී.එම්. කුමාරි මෙය - පාර්ලිමේන්තු නිලධාරි

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කර ගැනීමට හැක.

Select language → Business of Parliament → Committees
→ Committee Reports → Select Legislature (10th Parliament)
→ Select Session (1st Session) → Select Committee Type
→ (Comittees for Special Purposes) → Select Committee
→ (Committee on Public Accounts) → Search

# <u>පටුන</u>

<u>පිටු අංකය</u>


a. සභාපතිවරයාගේ සටහන ........ 7

b. සංක්ෂිප්ත වාර්තාව ........ 8

c. විශේෂිත නිරීක්ෂණ ........ 11

d. විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ, නිර්දේශ ........ 12

e. ඇමුණුම් ........ 100

f. සූචිය ........ 118

## සභාපතිවරයාගේ සටහන

නව වැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2024.03.19 දින සිට 2024.05.09 දින දක්වා සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ පස්වැනි වාර්තාව මෙලෙස ඉදිරිපත් කරමි. විගණනය නමින් හැඳින්වෙන පශ්වාත් ක්‍රියාවලියේදී හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රියව වැළැක්වීම වඩාත් ප්‍රතිඵලදායක වන බැවින් අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීම කෙරෙහි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වැඩි අවධානයක් යොමු කරන බව මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, මේ වන විට, රාජ්‍ය ආයතන පාර්ලිමේන්තුවට කැඳවා විමර්ශනය කිරීමට සමගාමීව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය ඔස්සේ ද සියලු රාජ්‍ය ආයතන වාර්ෂිකව ඇගයීමේ ක්‍රියාවලිය ද සාර්ථකව සිදු කරගෙන යන බව සඳහන් කරමි. මෙමගින් කාරක සභා විමර්ශනයන් වඩා යාවත්කාලීනව සිදු කිරීමට හැකිවන අතර ආයතනවල පවතින දුර්වලතා හා අඩුපාඩු හඳුනාගෙන කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ මගින් ඒවා නිවැරදි කරගැනීමට මගපෙන්වීමටත් අවස්ථාව සැලසෙන බව මාගේ අදහසයි.

ආයතන විමර්ශනය කිරීමේදී හඳුනාගත් අඩුපාඩු හා වැරදි නිවැරදි කර ගැනීමටත්, පවතින ධනාත්මක ගති ලක්ෂණ සහ ප්‍රවණතා වැඩි දියුණු කිරීමටත්, කාරක සභා රැස්වීම් මෙහෙයවීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමටත් අවශ්‍ය බව මා විසින් කාරක සභාවල කටයුතු කිරීමෙන් ලද දීර්ඝ අත්දැකීම් ඒත්තු ගන්වයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය යන්නෙන් අදහස් වන්නේ ඊට දායක වන සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලයයි. එබැවින්, මෙම කාරක සභාවේ සියලු සභික මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය නිසියාකාරව ක්‍රියාත්මක කරවීම පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සඳහා මා හට ලබාදෙන සහාය මම කෘතඥතා පූර්වකව අගය කරමි.

තවද, විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද, පාර්ලිමේන්තුවේ මහලේකම් ඇතුලු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

**කබීර් හෂීම්**
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## සංක්ෂිප්ත වාර්තාව

නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතනවලට අදාළව සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් විසින් කරන ලද පැහැදිලි කිරීම්, කාරක සභාව විසින් ලබාදෙන ලද නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2024.03.19 දින සිට 2024.05.09 දින දක්වා විමර්ශනය කරන ලද ආයතන හා /අදාළ විගණකාධිපති වාර්තාවන්හි කාල සීමාවන්.**

| | **ආයතනය** | **සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය / වර්තමාන කාර්යසාධනය** | **විමර්ශනය කරන ලද දිනය** |
|---|---|---|---|
| 01 | සෞඛ්‍ය අමාත්‍යාංශය | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වෛද්‍ය සැපයුම් සහ ඒ ආශ්‍රිත කරුණු පිළිබඳ ගැටළු විමර්ශනය කිරීම සඳහා වූ කාරක සභා වාර්තාවෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම | 2024 මාර්තු 19 |
| 02 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2020, 2021 සහ 2022 මුදල් වර්ෂ සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යසාධනය පරීක්ෂා කිරීම | 2024 අප්‍රේල් 02 |
| 03 | අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) ප්‍රගතිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 අප්‍රේල් 24 |

| | ආයතනය | සලකා බලන ලද විගණකාධිපති වාර්තා කාලසීමාව / පූර්ව කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය / වර්තමාන කාර්යසාධනය | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|---|
| 04 | සංචාරක අමාත්‍යාංශය | 2020, 2021 සහ 2022 මුදල් වර්ෂ පදනම් කරගනිමින් සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ සංචාරක අමාත්‍යාංශයේ වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීම | 2024 මැයි 07 |
| 05 | බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ මහාභාරකාර දෙපාර්තමේන්තුව | විගණකාධිපතිවරයා විසින් 2021 අප්‍රේල් මස 30 දින නිකුත් කරන ලද මහා භාරකාරතැන වෙත පවරා ඇති මුදල් දේපළ කළමනාකරණය පිළිබඳ වූ කාර්යසාධන විගණන වාර්තාව පරීක්ෂා කිරීම | 2024 මැයි 08 |
| 06 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඇතුළුව ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මූලිකත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, ජාතික ආර්ථික හා භෞතික සැළසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එක්ව 2024.01.24 දින කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශවල ප්‍රගතිය සමාලෝචනය කිරීම | 2024 මැයි 09 |

## කාරක සභාව විසින් පවත්වන ලද විශේෂ විමර්ශන

| | විශේෂ විමර්ශන | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|
| 01. | මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා කොළඹ මහා නගර සභාවේ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාව | 2024 මාර්තු 20 |
| 02. | සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ නරක් වූ මාළු අඩංගු බහාලුම් සහිත නැවක් කොළඹ වරායෙන් රට තුළට ගැනීම පිළිබඳ විගණන විමසුමෙන් හෙළිදරව් වූ කරුණු පරීක්ෂා කිරීම | 2024 මාර්තු 20 |

## විශේෂිත නිරීක්ෂණ

විමර්ශිත කාල පරිච්ඡේදය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතනවලට අදාළව පහත සඳහන් පොදු ගැටලු නිරීක්ෂණය කරන ලදී.

- **අභ්‍යන්තර විගණන ඒකක නොපැවතීම හා විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම.**
- **කාර්ය මණ්ඩල පුරප්පාඩු.**
- **පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නිර්දේශ සඳහා නියමිත කාල පරිච්ඡේදය තුළ පිළිතුරු නොසැපයීම.**
- **රජයට අයවිය යුතු ආදායම් නියමිත දිනට අයකර ගැනීමේ ප්‍රමාදය.**
- **රජයේ මුදල් අවභාවිතය.**
- **ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොපැවතීම.**

## විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ, නිර්දේශ

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| **සෞඛ්‍ය අමාත්‍යාංශය**<br>***(රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් සහ ඒ ආශ්‍රිත කරුණු පිළිබඳ ගැටළු විමර්ශනය කිරීම සඳහා වූ කාරක සභා වාර්තාවෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 මාර්තු 19** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ සෞඛ්‍ය අමාත්‍යාංශය<br>❖ ජාතික ඖෂධ නියාමන අධිකාරිය<br>❖ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | |
| 01 | **<u>අනු කාරක සභාව විසින් යෝජිත නිර්දේශ සලකා බැලීම යටතේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system) 2024 මාර්තු 31 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කිරීම.</u>** | මේ සම්බන්ධයෙන් සාකච්ඡා වාර කිහිපයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සිදුකර ඔවුන්ට අවශ්‍ය දත්ත ලබාදුන් නමුත් මෙහි වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය පාර්ශ්වයෙන් සෑහීමකට පත්විය නොහැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යම් කොටසක් 2024.03.31 දින වනවිට අවසන් කිරීමටත්, 2024.12.31 දින වනවිට පද්ධතියේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කළ බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී. නමුත් ලෝක බැංකු ආධාර මත අදාළ සමාගම සමඟ පැවති එකඟතාවය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සමාලෝචනය කර නව එකඟතාවයක් අත්සන් කිරීමට සිදුවූ බවත් 2024.08.31 වනවිට මෙම කාරක සභාව ලබාදුන් නිර්දේශයට අදාළ ජාතික තරඟකාරී ලංසු කැඳවීම් (National Competitive Bidding) හා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම් (International Competitive Bidding) ප්‍රසම්පාදන කොටස සකස් කර අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය පාර්ශ්වයෙන් සකස් කරන තුරු, විගණන අංශය මඟින් යෝජනා කරන ලද පියවරයන් අනුගමනය කිරීමට කටයුතු කරන ලෙසට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system) සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර එහි පියවරයන්, අවසන් කිරීමට බලාපොරොත්තු වන නිශ්චිත දිනවකවානු ඇතුළත් වාර්තාවක් 2024 අප්‍රේල් 02 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | **ස්වස්ථ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම** | සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින ස්වස්ථ මෘදුකාංග පද්ධතිය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. මෙහිදී පෙර පැවති පද්ධතිය මඟින් සියලු රෝහල් සම්බන්ධ සංඛ්‍යා දත්ත ලබාගත නොහැකි වූ බවත් නව සවස්ථ පද්ධතිය මඟින් එම තොරතුරු ලබාගත හැකි බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලද අතර 2024 වර්ෂයේ ඖෂධ ඇස්තමේන්තු සකස් කරන ලද්දේ මෙම ක්‍රමවේදය හරහා බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.<br><br>දිවයින පුරා පිහිටි රෝහල් වල තිබෙන ඖෂධ ප්‍රමාණයන්, ඒවායේ තොග අවසන් වන කාල සීමාව ආදී කරුණු පද්ධතිය හරහා පරීක්ෂා කරන ආකාරය පැහැදිලි කරන ලදී.<br><br>යළි තොග ඇණවුම් මට්ටම සම්බන්ධයෙන් රට පුරා පිහිටි රෝහල් සියල්ලෙන්ම තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් කාරක සභාව විමසා සිටි අතර එහිදී රෝහල් 1161 ක් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 361ක් දැනටමත් ස්වස්ථ පද්ධතියට සම්බන්ධ කර තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමෙන්ම මානව සම්පත හා වෛද්‍ය උපකරණ සම්බන්ධ තොරතුරු ද මෙම පද්ධතියට එක්කළ හැකි බව මෙහිදී අදහස් දක්වමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 03 | <u>ඖෂධ ඇණවුම් වල දෘඩ පිටපත් ලැබෙන තුරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ නොකිරීම</u> | පෙර පැවති මෘදුකාංග පද්ධතිය හරහා ඖෂධ ඇණවුම් කිරීමේදී අදාළ අනෙකුත් ලේඛන පෙන්නුම් කිරීමක් සිදු නොවුණ බැවින් දෘඩ ලේඛන ලැබෙන තුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නොහැකි බව මෙහිදී අදහස් දක්වමින් ජාතික ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කරන ලදී. |
| 04 | <u>ස්වස්ථ පද්ධතිය සායන හා රෝගියා දක්වාම ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම</u> | රෝගියා දක්වාම ඖෂධ නිකුත් කිරීම පිළිබඳ දත්ත ස්වස්ථ පද්ධතියට ඇතුළත් කිරීම, ඖෂධ තොග කළමනාකරණය සඳහා අවශ්‍ය නොවන බව මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එහිදී එම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වෙනුවෙන් වාර්ෂිකව වැය කිරිමට අපේක්ෂිත පිරිවැය අති විශාල බවත්, එය ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයකට දැරීමට සිදුවන විශාල වියදමක් බවත් හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 05 | <u>රෝගී වාර්තා සහ සායන කටයුතු සඳහා ස්වස්ථ මෘදුකාංග පද්ධතිය පුළුල් කිරීම</u> | ගෝලීය අරමුදල මඟින් මේ සඳහා වෙනම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සඳහා එකඟතාවයකට පැමිණ තිබෙන බවත් අපේක්ෂිත අරමුදල් ලැබුණු පසු රෝහල් 30 ක විද්‍යුත් රෝගී වාර්තා තබාගැනීමේ ක්‍රමවේදයක් (Electronic Patient Record System) 2025 ජූනි මාසය වනවිට සකස් කර අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ඉහත සඳහන් රෝහල් 30 ට අමතරව දැනට රටපුරා පිහිටි රෝහල් 90ක පමණ විද්‍යුත් තොරතුරු පද්ධති ක්‍රියාත්මක වන බවත් එම පද්ධති සියල්ල ජාලගතව ක්‍රියාත්මක කිරීම සඳහා ගෝලීය අරමුදල් ආධාර මඟින් සමෝධානිත ක්‍රමවේදයක් ද සැකසීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ආධාර ලබාදෙන බැවින් රටේ ප්‍රධාන රෝහල් සියල්ල ආවරණය වන පරිදි විද්‍යුත් රෝගී වාර්තා තබාගැනීමේ ක්‍රමවේදය පිහිටුවීමට හැකිවන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 06 | **<u>අසාධු ලේඛනගත කළ වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ ආයතන නැවත වෛද්‍ය සැපයුම් සිදු කිරීම වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම</u>** | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් හි අසාධු ලේඛනගත කර තිබෙන සැපයුම්කරුවන් සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය මඟින් ලිඛිතව ඉල්ලා තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලද අතර සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කිරීමට අදාළව නිර්ණායක සකස් කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පැවැත්වූ නමුත් මෙම අසාධු ලේඛනගත කිරීම පිළිබඳව දැනට නිශ්චිත මාර්ගෝපදේශ සකස් වී නොමැති බවත් එකී මාර්ගෝපදේශ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සකස් කර ඉදිරිපත් කිරීමට නියමිත බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ ආයතන අසාධු ලේඛනගත කළ ද වෙනත් නම් වලින් පෙනී සිටිමින් නැවත වෛද්‍ය සැපයුම් සිදු කිරීම වැළැක්වීම සඳහා පියවර ගත යුතු බවත් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳ සාකච්ඡාවේ දී තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ ආයතන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අසාධු ලේඛනගත කිරීමේ ක්‍රමවේදය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙතින් ලබාගන්නා ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 07 | <u>**අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නැවත ස්ථාපනය කිරීම.**</u> | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය තුළ රැස්වීම් වාර කිහිපයක් පැවැත් වූ බව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ ද මෙහි නෛතික කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් සති කිහිපයක් තුළ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. සඳහන් කළේය. <br><br> <u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u> <br><br> සුදුසු සාකච්ඡාවන් සිදුකර සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නැවත ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව වෙත 2024 මැයි 17 දිනට පෙර දැනුම්දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| 08 | <u>**ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා දීර්ඝ කාලයක් ගත වීම වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ වෙනම ප්‍රසම්පාදන අංශයක් ඇති කිරීම හා ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම**</u> | විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system) ක්‍රියාත්මක කිරීම තුළින් වෛද්‍ය සැපයුම් ප්‍රමාදයන් අවම කර ගැනීමේ හැකියාවක් ඇති බව මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළ අතර කාරක සභාව පෙන්වා දුන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කරන බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. <br><br> රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් දැනට සංස්ථාවේ නිලධාරීන්ගේ භාවිතය සඳහා ප්‍රසම්පාදන අත්පොතක් පිළියෙල කර තිබෙන බවත් එක් එක් ප්‍රසම්පාදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | පියවරයන්ට ගතවන කාලය නිශ්චය කොට දක්වා තිබෙන බවත්, ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් ද එහි සඳහන් කර තිබෙන බවත් ඉදිරියේ දී එය කාරක සභාව වෙත ලැබීමට සලස්වන බවත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ප්‍රකාශ කළේය. |
| 09 | <u>**දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු හිඟ බිල්පත් වටිනාකම් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සතු දත්තවල පරස්පරතාවයක් පැවතීම**</u> <br><br> ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා දීර්ඝ කාලයක් ගත වීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම තුළින් මේ සඳහා විසඳුම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වෙනම අංශයක් (Procurement Dvision) ස්ථාපනය කළ බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. <br><br> ඖෂධ ප්‍රසම්පාදන කටයුතු සඳහා ගතවන කාල සීමාව අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නව මාර්ගෝපදේශ සකස් කරමින් තිබෙන බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 10 | <u>**සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024 වසරට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම**</u>. | සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා 2024 වසරේදී වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මේ වනතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. <br><br> <u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u> <br><br> අයවැය ප්‍රතිපාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම අදාළ කාල රාමුව තුළදී ලබාදීම සිදුකළ යුතු බවට නෛතික අවශ්‍යතාවයක් තිබෙන බැවින් 2024 වසරට අදාළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම කඩිනමින් පිළියෙල කර මසක කාලයක් තුළ එම සැලැස්මෙහි පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 11 | **රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සිදු කරන සැපයුම් ප්‍රමාදයන් පාලනය කිරීමට ඔවුන් වෙත ගෙවනු ලබන 10% ක සේවා ගාස්තුවෙන් අධිභාරයක් අයකර ගැනීම** | තම සංස්ථාවේ නිලධාරීන්ගේ පාලනයෙන් තොරව සිදුවන ප්‍රමාදයන් සඳහා මෙම අයකිරීමෙන් නිදහස් කරන ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා කාරක සභාවෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා සිදුකරන සැපයුම් වෙනුවෙන් නිසි කලට මුදල් නොලැබීම හේතුවෙන් රු. බිලියන 20ක බැංකු අයිරාවක් තම සංස්ථාව ලබාගෙන තිබෙන බවත් අදාළ බැංකු අයිරාවේ පොලිය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් ගෙවන බවත් හෙතෙම තවදුරටත් ප්‍රකාශ කළේය.<br><br>රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2008 වසරේ සිට නොගෙවා එකතු වූ රු. බිලියන 34ක පමණ මුදලක් ගෙවීම සඳහා දැනට කමිටුවක් පත්කර ගනුදෙනු හඳුනාගැනීම් සිදුකරමින් පවතින බවත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් මෙහිදී සඳහන් වූ අතර රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2024 මාර්තු මස ආරම්භය වනතෙක් වර්තමාන සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සිදු කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ විය. |
| 12 | **2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තියේ ප්‍රධාන කරුණු වලට පරිබාහිර කරුණු සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම අත්හිටුවීම.** | මෙහිදී ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහා අනුක්‍රමික අංකයක් හඳුන්වා දීම, ආරක්ෂිත මුද්‍රාවක් භාවිත කිරීම, අදාළ සහතිකය ඉල්ලුම්කරුට/ ආනයනකරුට සෘජුව ලබා දීම වහාම නතර කර එහි වගකීම ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට පැවරීම හා ඖෂධ නිදහස් කිරීමට පෙර එම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සහතිකයේ නිවැරදිතාවය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වෙබ් අඩවිය මඟින් තහවුරු කර ගන්නා ලෙස ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට උපදෙස් දීම වැනි ක්‍රමවේද හඳුන්වා දීම, අත්‍යාවශ්‍ය අවස්ථා වලදී එම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම වගකීමක් සහිත කමිටුවක අනුමැතිය මත සිදු කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග කඩිනමින් අනුගමනය කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කළ විගණකාධිපතිවරයා මේ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය මෙතෙක් ගෙන ඇති පියවරයන් පිළිබඳව තම ප්‍රශංසාව පළ කළේය. |
| 13 | <u>**නව ඖෂධයක් ලියාපදිංචි කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා ලබා දී ඇති දින 300ක කාල සීමාව නැවත සමාලෝචනය කර කෙටි කාලයකින් ඖෂධයක් ලියාපදිංචි කිරීමේ හැකියාව සොයා බැලීම හා එකම ඖෂධය වෙළෙඳ නාම රාශියකින් ලියාපදිංචි කිරීම සීමා කළ යුතු බව**</u> | මේ වන විට ලියාපදිංචි කිරීම අළුත් කිරීමට නොහැකි වූ ඖෂධ සඳහා අදාළ ලියාපදිංචි කාල සීමාව තාවකාලිකව දීර්ඝ කිරීමට හා මීට අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු හා නව ඖෂධ ලියාපදිංචි කිරීම් කඩිනමින් සිදුකිරීමටත් කටයුතු කරමින් සිටින බවත් අධිකාරියට අවශ්‍ය නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව ඖෂධ ලියාපදිංචි කිරීමේ කාල සීමාව තවදුරටත් අඩුකිරීම සඳහා කටයුතු කළ හැකි බවත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා ප්‍රකාශ කළේය. <br><br> එසේම නව ඖෂධය ලියාපදිංචි කිරීමේ කටයුතු ද මීට සමගාමීව සිදුකරනු ලබන අතර වෙළෙඳ නාම 5 කට වඩා අඩුවෙන් පවතින ඖෂධ සඳහා ප්‍රමුඛතාව හිමිවන බව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 14 | <u>වෛද්‍ය සැපයුම් වට්ටෝරු සමාලෝචන කමිටුව නියමිත කාලයට රැස්කළ යුතු අතර එහි නිර්දේශයකින් තොරව කිසිදු වෛද්‍ය සැපයුමක් මිළදී නොගත යුතු බව සහ ,අදාළ කමිටු වාර්තාව වසර අවසානයේ දී නිකුත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම කළ යුතු බව</u> | 2022 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පත් කර ඇති "වෛද්‍ය සැපයුම් වට්ටෝරු සමාලෝචන කමිටුව" ඖෂධ සම්බන්ධයෙන් වසර 2 කට වරක් හා ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර අයිතම සම්බන්ධයෙන් වසර 3 කට වරක් රැස්වී සමාලෝචනයන් සිදු කරනු ලබන බවත්, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව පත්කළ, සියලුම අංශවල වෛද්‍ය විශේෂඥන්ගෙන් සැදුම් ලත් කමිටුවක් මඟින් මිලට ගන්නා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග ප්‍රමාණයන් සීමා කළ බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. <br><br> මෙහිදී අදාළ සමාලෝචනයන් සිදු කිරීමේ කාලසීමාව තවදුරටත් අඩු කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද කාරක සභාව විසින් විමසන ලදී. <br><br> ප්‍රායෝගික හේතූන් නිසා මෙම සමාලෝචන කාල සීමාව අඩු කිරිමට හැකියාවක් නොමැති බව ප්‍ර.ග.නි. කාරක සභාවට දන්වා සිටියේය. |
| 15 | <u>වෛද්‍ය සැපයුම් ක්‍රියාවලිය කළමනාකරණය සඳහා තොග කළමනාකරණය පිළිබඳව වෘත්තීමය සුදුසුකම් ඇති අයගේ සේවාව ලබා ගැනීමට කටයුතු කිරීම හා මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන්ට තොග කළමනාකරණය පිළිබඳ නිසි පුහුණුවක් හා යාවත්කාලීන දැනුමක් ලබා දීමට ක්‍රමවේදයක්</u> | තොග කළමනාකරණය පිළිබඳ වෘත්තීය දැනුමක් තිබෙන අයගේ සේවාව ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර තොග පාලන වෛද්‍ය සැපයුම් හා අංශවලට අනුයුක්ත නිලධාරීන්ට හා ඖෂධවේදීන් සඳහා 2024 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා තොග පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇති බවත් වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන්ගේ සහය ලබාගෙන අදාළ නිලධාරීන්ට විධිමත් පුහුණුවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සැකසීම.** | ප්‍ර.ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. |
| 16 | **ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පරීක්ෂණාගාර පහසුකම් පුළුල් කිරීම හා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම** | මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ගොඩනැගිලි කිහිපයක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට ලබා දීම සඳහා දැනට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු ගොඩනැඟිලි ද භාවිත කරමින් අධිකාරිය සතු පර්යේෂණාගාරය පුළුල් කිරීමට අවස්ථාව සැලසෙන බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. <br><br> මෙම කාර්ය සඳහා අවශ්‍ය උපදේශන කටයුතු සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) කණ්ඩායමක් අප්‍රේල් මස 28 වන දින ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළ අතර මිනුම් ඒකක ගොඩනැගිල්ල පරීක්ෂාකර බැලීමෙන් අනතුරුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් එය පරීක්ෂණාගාරය පිහිටුවීම සඳහා නුසුදුසු බව ප්‍රකාශ කළ බව කාරක සභාවට දන්වා සිටියේය. |
| 17 | **සෑම මසකම පළමු සතිය තුළ ඖෂධ හා චිකිත්සක කමිටු (Drug and Therapeutics Committee) පැවැත්වීම** <br><br> ඖෂධවල පවතින ප්‍රමාණයන්, ඖෂධ හිඟවීම් හා අතිරික්තයන් හා ඖෂධ භාවිතයෙන් ඇති වන සංකූලතා ආදිය පිළිබඳව මාසිකව | ප්‍රධාන රෝහල්වල මෙම රැස්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිලධාරියෙකු සහභාගී වන බවත් මාස 2කට වරක් පවත්වනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේ දී මෙම වාර්තාව ලබා දුන් හා නොදුන් නාමලේඛනයක් ප්‍රදර්ශනය කරනු ලබන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු ප්‍රකාශ කළහ. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | වාර්තා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇති නමුත් ආයතන 380 ක් අතුරින් ආයතන 139ක් පමණක් එම වාර්තා එවා ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙහිදී රෝහලේ හිඟ ඖෂධ, දත්ත පද්ධතීන් භාවිත කිරීම තුළින් හඳුනාගැනීමටත් ඉදිරි ඖෂධ අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගැනීම මඟින් කල් ඇතිව ඖෂධ ඇණවුම් කිරීමට කටයුතු කිරීම හරහා රෝහල් මඟින් සිදුකරනු ලබන දේශීය මිලදී ගැනීම් අවම කළ යුතු බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 18 | **<u>සමීක්ෂණයක් සිදුකර, රෝහල්වල හිඟ, අතිරික්ත හා ඌන උපයෝජිත වෛද්‍ය උපකරණ පිළිබඳව පරිගණක දත්ත පද්ධතියක් සකසා අවශ්‍යතාවය අනුව වෛද්‍ය උපකරණ රෝහල් අතර මාරු කිරීම හා ප්‍රමුඛතා පදනම (Priority List) මත වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනයන් සිදු කිරීම සහ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය මඟින් අදාළ වාර්තා පවත්වා ගැනීම.</u>** | දැනට යම් මට්ටමකින් වෛද්‍ය උපකරණ පිළිබඳව ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියක් පවත්වාගෙන යන බවත් රෝහල් තුළ තිබෙන ප්‍රධාන වෛද්‍ය උපකරණ පිළිබඳ දත්තයන් සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව පවතින බවත් සෙසු ප්‍රධාන උපකරණ 25000 ක පමණ දත්ත පද්ධතිය සකසමින් පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමෙන්ම මෙම යෝජිත කාර්යයන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රතිපාදන හිඟකම සම්බන්ධයෙන් කාරක සභාව දැනුවත් කළ හෙයින් මෙම මේ හේතුවෙන් අමාත්‍යාංශය විසින් පත්කළ කමිටුවකට ඉදිරිපත් කර ප්‍රමුඛතා අනුපිළිවෙලකට අනුව වැඩකටයුතු සිදු කරමින් පවතින බව වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>එමෙන්ම ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ඉංජිනේරු සහ තාක්ෂණික ශිල්පීන් සීමා සහිත වීම හේතුවෙන් මෙම කාර්යයන් කඩිනමින් සිදු කිරීම දුෂ්කර බව මෙහිදී අමාත්‍යාංශ නිලධාරීහු පෙන්වා දුන් අතර පසුගිය වර්ෂයන්හි වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | බවත් ඒ සඳහා රු. බිලියන 60ක පමණ මුදලක් අවශ්‍ය වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 19 | රට තුළ තිබෙන රෝහල් වර්ගීකරණයක් සිදු කර අදාළ රෝහල් වර්ගය අනුව අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා පොදු පිරිවිතරයන් ඇතුළත් චක්‍රලේඛයක් ජීව වෛද්‍ය ඉංජිනේරු/ රසායනාගාර සේවා අංශය මඟින් නිකුත් කිරීමට කටයුතු කිරීම හා මෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් **2023.12.31** දින වනවිට කාරක සභාව වෙත ලැබීමට සැලැස්විය යුතු බව | මේ සම්බන්ධයෙන් දැනට කටයුතු කරමින් පවතින බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. දැනට රට තුළ තිබෙන රෝහල්වල වර්ගීකරණයක් පවතින බැවින්, එම වර්ගීකරණයට අනුව අදාළ රෝහල් වල පැවතිය යුතු වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් සැලැස්මක් විශේෂඥ වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කර අමාත්‍යාංශය මඟින් සකස් කරමින් පවතින බවත් ඒ අනුව මාස කිහිපයක් ඇතුළත මීට අවශ්‍ය චක්‍රලේඛයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 20 | ඖෂධ විධිමත් ලෙස අවශ්‍ය උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා නොකිරීම හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය පහත වැටීමක් සිදුවන බැවින්, ඖෂධ ප්‍රමිතීන් පිළිබඳ විමර්ශන කටයුතු වලදී භාවිත කිරීම සඳහා, ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර් සාම්පල් මෙන්ම ලබාගන්නා නියැදි සාම්පල්, එම තොගය රෝහල් වෙත නිකුත් කර භාවිතයෙන් අවසන් වන තුරු නිසි ප්‍රමිතීන්ට අනුකූලව ගබඩා කර තැබීමට කටයුතු කිරීම. | ඖෂධ ගබඩා කර තැබීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති බැවින් ඖෂධ ගබඩා කිහිපයක් වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගෙන ඇති බවත් ප්‍රකාශ කළ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් දැනට නියැදි සාම්පල ගබඩා කර තැබීම සිදු කරන නමුත් එම ඖෂධ ප්‍රශස්ත උෂ්ණත්වයේ ම තිබෙන බවට සහතික විය නොහැකි බවත් ඉදිරියේදී නියැදි සාම්පල සඳහා ගබඩාවක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළහ.<br><br>තත්ත්වයෙන් අසමත් ඖෂධ තොග නියමිත උෂ්ණත්ව පරාස තුළ ගබඩා කර තැබීමක් සිදු නොවන බැවින් තත්වයෙන් අසමත් ඖෂධ සඳහා අලාභ අයකර ගැනීම් හා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සම්බන්ධ නඩු කටයුතුවල දී එය අවාසිදායක අයුරින් බලපෑම කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.<br><br>ආහාර දෙපාර්තමේන්තුව සතුව දැනට පවතින වේයන්ගොඩ ගබඩාව සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරාගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු ප්‍රකාශ කළහ. |
| 21 | **<u>ප්‍රධාන වෛද්‍ය උපකරණ වලට අදාළ නඩත්තු හා සේවා ගිවිසුම්, අත්‍යවශ්‍ය සායන කටයුතු සඳහා භාවිත වන වෛද්‍ය උපකරණ ක්‍රියා විරහිත වීම් සහ අලුත්වැඩියා කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය වන තොරතුරු ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත මාර්ගගත දත්ත පද්ධතියක් මඟින් වාර්තා කිරීම.</u>** | ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් සිදුකරනු ලබන නඩත්තු කිරීම් 548ක පමණ Microsoft excel ලේඛනයක් ලෙස දැනට සකස් කර තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් ප්‍රකාශ කළහ.<br><br>පසුගිය සමයේ තිබූ මූල්‍ය අර්බුදය හේතුවෙන් රෝහල් තුළ පැවති ප්‍රධාන වෛද්‍ය උපකරණ වලට ද සේවා ගිවිසුම් (Service Agreements) අත්සන් නොකළ බවත් මෙම වසරේ රු. බිලියන 4ක පමණ මුදල් ප්‍රතිපාදන ලැබීමත් සමඟ එම සේවා ගිවිසුම් යාවත්කාලීන කර ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි ප්‍රකාශ කළේය. |
| 22 | **<u>රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සියලුම ඇණවුම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් පිරික්සුම් ලැයිස්තුවක් (Check list) සැකසීම සහ එය වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ හා නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ දිනපතා අධීක්ෂණයට ලක් කිරීම.</u>** | ස්වස්ථ පද්ධතිය ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයක් හරහා ඕනෑම අවස්ථාවක ඇණවුම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම් සිදුකළ හැකි බවත් සෑම සතියකටම වරක් සෞඛ්‍ය ලේකම් විසින් අදාළ නිලධාරීන් කැඳවා ප්‍රගතිය සම්බන්ධ පරීක්ෂාවක් සිදුකරනු ලබන බවත් ඊට අමතරව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්ද සෑම සතියකටම වරක් පසු විපරමක් (re-view) සිදු කරනු ලබන බවත් සෞඛ්‍ය |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | අමාත්‍යාංශ නිලධාරීහු කාරක සභාව හමුවේ ප්‍රකාශ කළහ.<br><br>මීට අමතරව ආයතන හා රෝගීන් මඟින් පැමිණිලි ලැබෙන අවස්ථාවන්හි ස්වස්ථ පද්ධතිය ඔස්සේ අදාළ පරීක්ෂා කිරීම් සිදුකරනු ලබන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීහු වැඩිදුරටත් ප්‍රකාශ කළහ. |
| 23 | **<u>සියලුම හදිසි මිළදී ගැනීම් වලදී අදාළ ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දිය යුතු අතර එහි ඖෂධය පිළිබඳ තොරතුරු හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඇණවුම්හි ප්‍රගතිය, තොග ලැබීමේ දින වකවානු, තොග සැපයීමේ ප්‍රමාදවීම් හා ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න සඳහන් කිරීම.</u>** | හදිසි මිලදී ගැනීම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දැනට සම්පූර්ණයෙන්ම නතර කර තිබෙන බවත්, ආයතන මට්ටමින් සිදුකරන මිලදී ගැනීම් සඳහා ආකෘති පත්‍රයක් පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>රෝහල් මට්ටමින් සිදුකරනු ලබන මිලදී ගැනීම් සඳහා ආකෘති පත්‍රයට මෙම කාරණා ද ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව නිර්දේශ කළේය. |
| **මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය හා කොළඹ මහා නගර සභාවේ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාව**<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2024 මාර්තු 20** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>❖ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>❖ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව<br>❖ බස්නාහිර පළාත් සභාව<br>❖ කොළඹ මහා නගර සභාව | | |
| 01 | **<u>මහා කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියේ සැලැස්ම යාවත්කාලීන කිරීම.</u>** | • 1896 වර්ෂයේ දී සැලසුම් කර ඇති කොළඹ මළ නාලිකා පද්ධතියෙහි ඉදි කිරීම් 1906 වර්ෂයේ දී ආරම්භ කර ඇති බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | • වර්තමානයේ ස්ථාපිත මළ නාලිකා පද්ධතියෙන් 90%ක් පමණ 1925 වර්ෂය වන විට අවසන් කර තිබූ බවත්,<br>• රජය විසින් 1972 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතියට සකස් කළ ප්‍රධාන සැලැස්ම (Master Plan) මත පදනම්ව වර්ෂ 1980 ගණන්වල දී මෙම පද්ධතියේ වැඩි දියුණු කිරීමක් සිදු කර ඇති බවත්,<br>• 1990 වර්ෂවලදී එම ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කර ඇති බවත්,<br><br>කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>රජය විසින් 1999-2000 වර්ෂ තුළදී කොළඹ මලාපවහන පද්ධතිය (Colombo Sewerage System) සඳහා තත්ත්ව තක්සේරුවක් (Condition Assessment) සිදු කර ඇති බව අනාවරණය වූ අතර එම තත්ත්ව තක්සේරුව මත පදනම්ව 2009 වර්ෂයේදී රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කළ බවද ඒ අනුව මහා කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියට ඇමරිකානු ඩොලර් මිලියන (ඇ.ඩො.මි.) 110ක ණය මුදලක් ලබා දී ඇති බවද කාරක සභාව හමුවේ අනාවරණය විය.<br>• මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය Greater Colombo Wastewater Management Project (GCWMP) සහ මහා කොළඹ ජලය සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය Greater Colombo Water & Wastewater Management Improvement Investment Project |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | (GCWWMIIP) ලෙස ව්‍යාපෘති 02ක් ඇති බවත්,<br>• මහා කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය තුළ ඇ.ඩො.මි. 80ක් සහ ඇ.ඩො.මි. 19.1 ලෙස ණය (Loans) 02ක් ඇති බවත්,<br>• ණය ගිවිසුම 2009.09.28 දින අත්සන් කර ඇති අතර එය 2010.04.09 දින බලාත්මක (Effective) වී ඇති බවත්,<br><br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ව්‍යාපෘතියේ සංකීර්ණත්වය හා ස්වභාවය අනුව, 2023.06.30 දින වන තුරු දීර්ඝ කිරීම් (Extension) 05ක් සමඟින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇති බවද අනාවරණය විය. |
| 02 | <u>මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ පවතින සිවිල් කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු</u> | මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සිවිල් කොන්ත්‍රාත් 04ක් පවතින බව කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>කොළඹ මළ නාලිකා පද්ධතිය උතුරු පද්ධතිය සහ දකුණු පද්ධතිය ලෙස ප්‍රධාන කොටස් 02කට පවතින බවත්, උතුරු පද්ධතිය මෝදරින් සහ දකුණු පද්ධතිය වැල්ලවත්ත ප්‍රදේශයෙන් මුහුදට බැහැර වන බවත් අනාවරණය විය.<br><br>▪ ඇ.ඩො.මි. 11.63 ක වටිනාකමින් යුත් “Rehabilitation of Sea Outfalls” කොන්ත්‍රාත්තුව යටතේ මෝදර නල මාර්ගය (pipe line) ප්‍රතිස්ථාපනය (replace) කළ බව හා වැල්ලවත්ත නල මාර්ගය පිරිසුදු කිරීමේ කටයුතු සිදු කළ බව, |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ▪ කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො.මි. 26.04 වටිනාකමකින් යුතු “Rehabilitation of Gravity Sewers and Condition Assessment of Sewers” කොන්ත්‍රාත්තුව යටතේ, කොළඹ නගරයේ මළ නාලිකා පද්ධතියෙන් කොටසක් පුනරුත්තාපනය කිරීමට හා කිලෝ මීටර් (කි.මී.) 125ක දුරක සී.සී.ටී.වී. සමීක්ෂණයක් (CCTV Survey) සිදු කිරීම හා කි.මී. 8.62 දිග නල පද්ධතිය නැවත එලීම සිදු කළ බව හා එහි කටයුතු ද මේ වන විට අවසන් බව,<br><br>ග.නි. ප්‍රකාශ කළේය.<br><br>▪ ඇ.ඩො.මි. 2.45 වටිනාකමකින් යුතු “Repair of Wanathamulla Gravity Sewers” කොන්ත්‍රාත්තුව යටතේ වනාතමුල්ල බන්ධනාගාරයේ ගැටළුවක් හේතුවෙන් කි.මී. 2ක් දිග නල මාර්ග නැවත එලන ලද බව අනාවරණය විය.<br><br>▪ 2023.06.21 දින පැවැත් වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡා කළ කොළඹ මහා නගර සභාවේ මළ නාලිකා පද්ධතිය හා සම්බන්ධ කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් කාන්තා රැඳවියන්ගේ නේවාසික ගොඩනැගිල්ලෙහි මල අපවහන පද්ධතිය පිළිසකර කිරීම දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයක සිදුකර ඇති අනවසර ඉදි කිරීම හේතුවෙන් සිදු කළ නොහැකි වීම පිළිබඳව සාකච්ඡාවට ලක් වීය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | මෙහිදී Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම හා සම්බන්ධ වූ දුම්රිය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරිනිය අවසාන පියවර වශයෙන්, හඳුනාගත් අනවසර පදිංචිකරුවන් තිදෙනෙකුට එරෙහිව, කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 03ක් පවරා ඇති බවත්, එම නඩුව 2024.03.22 දින යළි කැඳවීමට නියමිත බවත් ප්‍රකාශ කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>• එම අනවසර පදිංචිකරුවන්ගේ නිවාස සඳහා කොළඹ මහා නගර සභාව විසින් වරිපනම් අංක නිකුත් කර තිබීම ගැටළු සහගත බව කාරක සභාව අවධාරණය කළේය.<br>• මහා නගර සභා ආඥා පනත අනුව ජලය බැස යාම සහ අනවසර ඉදිකිරීම් සම්පූර්ණයෙන් ඉවත් කිරීමට කොළඹ මහා නගර සභාවට බලය ඇති හෙයින් මේ සම්බන්ධයෙන් මහා නගර සභා පනතට අනුව ක්‍රියාකළ යුතු බව විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.<br>• මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කළ හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව ද සොයා බලන ලෙස කාරක සභාව විසින් ග.නි. වෙත උපදෙස් දෙන ලදි.<br>• කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව (DCC) මඟින්ද මේ සම්බන්ධයෙන් සක්‍රීය මැදිහත් වීමක් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | සිදුකළ හැකි බව සභාපතිවරයා පෙන්වා දුන්නේය.<br><br>කොළඹ නගරයේ පොම්පාගාර (Pumping Stations) 8ක් අලුත්වැඩියා කිරීමට හා Force Mains 02ක් නැවත යෙදවීමටත් අදාළ ඇ.ඩො.මි. 57.12ක වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. එම කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ඉන්දියානු සමාගම විසින් එහි කටයුතු අවසන් කර නොමැති බව මෙන්ම එම ව්‍යාපෘතියෙහි අකාර්යක්ෂමතාව පිළිබඳව ද කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය.<br><br>තලකොටුව ගාර්ඩ්න් ව්‍යාපෘතිය, කිරුළපන ප්‍රදේශයේ පොම්පාගාර 02ක් ඉදි කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ ව්‍යාපෘතියක් බවත්, වර්ෂ 03ක් සඳහා වූ එම කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේ දී කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කළ බවත් කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ව්‍යාපෘතියට දුන් ණය 2022 ඔක්තෝම්බර් මාසයේ අවසන් වූ පසු කොන්ත්‍රාත්තුව අවසන් වූ බව අනාවරණය වූ අතර, මේ වන විට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එම ව්‍යාපෘතියට දේශීය අරමුදල් ලබා ගැනීමට කටයුතු කර නැවත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවද අනාවරණය විය.<br><br>▪ "Rehabilitation of Wastewater Pumping Stations" කොන්ත්‍රාත්තුවේ 70%ක පමණ වැඩ අවසන් කර ඇති බවත්, එම ව්‍යාපෘතිය තුළ පොම්පාගාර 8ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබූ බවත්, ඉන් පොම්පාගාර 4ක වැඩ අවසන් කර කොළඹ මහා නගර සභාවට භාර දී ඇති බවත්, එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වූ කොම්පඤ්ඤවීදිය පොම්පාගාරය 2024 මැයි මාසය අවසන් වන විට කොළඹ වරාය නගර නල මාර්ගයට (port city line) සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වන බවත් කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වැඩ අවසන් නොවූ ඉතිරි පොම්පාගාර 4 පිළිබඳව කාරක සභාව විමසන ලදි. එම පොම්පාගාරවල කටයුතු කරගෙන යාමට රජයේ අරමුදල් වලින් ඇ.ඩො.මි. 20 ක් ලබා දී ඇති බව අනාවරණය විය.<br><br>එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් මාලිගාවත්ත පොම්පාගාරයේ කටයුතු සිදුවන බව ග.නි. ප්‍රකාශ කළේය. එම කොන්ත්‍රාත්තුවට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයට පසු නව සංශෝධනයක් (Contract Amendment) ඇතුළත් කොන්ත්‍රාත් ගිවිසුම 2024.02.21 දින අත්සන් කළ බවත් කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින් 2025.12.31 දිනට අවසන් කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | තීරණය ලබා දී ඇති බව ද ග.නි. ප්‍රකාශ කළේය.<br><br>එම පොම්පාගාර පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මට (Action plan) හා වැඩසටහනට (Work Programme) ඇතුළත් ඒ ඒ කාර්යයන් අවසන් කිරීමට කාලවකවානු ඇතුළත් කරගන්නා ලෙසත්, ව්‍යාපෘතියේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලෙසත් (progress review meetings) එම රැස්වීම්වල කාර්යය සටහන් පිටපත් විගණකාධිපතිවරයාට ද පිටපතක් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, කාරක සභාව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / කොළඹ මහා නගර සභාවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>එම කොන්ත්‍රාත්තුව පිළිබඳ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මාසික සමාලෝචන රැස්වීම් පවත්වන බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PL/05/09/COPA-2024 හා 2024.04.19, 2024.05.13 සහ 2024.10.15 දිනැති ලිපි මඟින් 2024.04.02/ 2024.04.18/ 2024.09.04 දිනවල පැවැත්වූ ප්‍රගති සමාලෝචන** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | | **රැස්වීම්වල කාර්යය සටහන් පිටපත් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම I)**<br><br>**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PL/05/09/COPA-2024 දරන 2024.06.18 දිනැති ලිපිය මගින් ක්‍රියාකාරී සැලැස්ම හා වැඩසටහනෙහි මෘදු පිටපත ඉදිරිපත් කර ඇත.** |
| 03 | **<u>කොළඹ නගරයේ මාර්ගවල සවිකර ඇති දැන්වීම් පුවරු / LED Boards ප්‍රදර්ශනයෙන් ආදායම් ඉපයීම.</u>** | දැන්වීම් පුවරු / LED Boards ප්‍රදර්ශනයෙන් කොළඹ මහා නගර සභාව විසින් උපයන ආදායම පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි බව කාරක සභාව අවධාරණය කළේය. දැන්වීම් පුවරු ප්‍රදර්ශනයෙන් රු.මිලියන 43ක ආදායමක් උපයන බව ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>කොළඹ නගරයේ මාර්ගවල සවිකර ඇති දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා අදාළ පෞද්ගලික සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුමේ පිටපතක් ද සමඟ එමගින් ලබන ආදායම පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/COPA/2024(I) හා 2024.07.12 දිනැති ලිපියෙන් ඉහත** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 04 | **<u>කොළඹ නගර සභා බල ප්‍රදේශයේ රථවාහන ගාල් කිරීම (Vehicle Parking)</u>** | කොළඹ නගරයේ දිනකට වාහන 5000ක් පමණ නවතා තැබීමට මාර්ගය දෙපස සලකුණු කර ඇති බවත්, ඒවායින් ආදායම් ලබන මාර්ග පුවත්පත් මඟින් ටෙන්ඩර් කැඳවා ලබා දී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>කොළඹ නගරයේ අක්‍රමවත් රථ වාහන නතර කිරීම තුළින් කඩ හිමියන්ට සිදු වන අවහිරය මගහැරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය සහ අතරමැදි පිරිසක් අයුතු ලාභ ලැබීම පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව විධිමත් ලෙස වාහන නතර කිරීමේ පහසුකම් ඇති කර ඉන් නගර සභාවට සැලකිය යුතු ආදායමක් ලබා ගැනීමේ අවශ්‍යතාවය මෙන්ම රථ වාහන හිමියන්ගෙන් අයුතු ලෙස මුදල් අයකිරීම නතර කිරීමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය.<br><br>කොළඹ නගරය තුළ විධිමත් ලෙස වාහන නැවැත්වීමට සලසා ඇති පහසුකම් හා ලබන ආදායම් පිළිබඳ වාර්තාවක් 2024 අප්‍රේල් 22 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි. /ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/ COPA/2024(I) හා 2024.07.12 දිනැති ලිපියෙන් කොළඹ නගරයේ එක් එක් රථගාල් ස්ථාන වලින් ලැබෙන මාසික** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ලැබෙන මාසික ආදායම රු.22,003,730.00 වන බව වාර්තා කර ඇත. (ඇමුණුම II) |
| 05 | **<u>කොළඹ නගරයේ වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව විසින් අවිධිමත් ලෙස බැහැර කරනු ලබන අපද්‍රව්‍ය / කසළ පිළිබඳව හා ඒ හරහා සිදුවන පාරසරික හානිය</u>**<br>• අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළව දඩ පැනවීමේ ක්‍රමවේදයක් පවතීද යන්නත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙල කවරේද යන්නත් පිළිබඳව කාරක සභාව විමසීය.<br>• රජය විසින් රු.බිලියන 106ක වියදමක් දරා ඉදිකළ 2019 අප්‍රේල් මස ක්‍රියාත්මක වූ අරුවක්කාරු කසළ අංගනය කාර්යක්ෂමව භාවිතා නොකිරීම පිළිබඳව මෙන්ම Waste to Energy ව්‍යාපෘතිය පිළිබඳව ද කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය. | වතු ජනතාව විසින් කසළ හා වැසිකිළි අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමට අදාළව දඩ පැනවීමේ ක්‍රමවේදයක් පැවතිය ද දැනට ක්‍රියාත්මක පනත අනුව එය ප්‍රමාණාත්මකව සුළු අගයක් ගන්නා බව ද කාරක සභාවේ දී අනාවරණය විය.<br>• කොළඹ නගරයේ වතු ජනාවාස 1360 ක් පමණ ඇති බව සහ පවුල් 65,000කට ආසන්න ප්‍රමාණයක් ඒවායේ ජීවත් වන බවත්,<br>• කොළඹ නගර සභා බල ප්‍රදේශය තුළ පොදු මහජන පැමිණිලි ඉදිරිපත් කිරීමට පොදු WhatsApp අංකයක් හඳුන්වා දී ඇති බවත්, ග.නි. ප්‍රකාශ කළේය.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>Waste to Energy ව්‍යාපෘතිය යටතේ කසළ ටොන් විශාල ප්‍රමාණයක් එකතු වී තිබුණ ද එම ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක නොවීම තුළ අනාගතයේ දී අර්බුදකාරී තත්ත්වයක් ඇති විය හැකි බව අවධාරණය කළ කාරක සභාව ඊට මැදිහත්වී ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි. වෙත උපදෙස් දුන්නේය.<br>• කොළඹ නගර සභා බල ප්‍රදේශයේ කසල / කුණු ඇති ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමට WhatsApp හා මුහුණු පොත (Facebook) හරහා දැන්වීම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | පළකිරීම මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලෙසත්,<br>• කොළඹ නගරයේ කසළ බැහැරකිරීම පිළිබඳ වැඩි අවධානයක් හා අධීක්ෂණයක් යොමු කර කටයුතු කරන ලෙසත්,<br>• කොළඹ නගරයේ කසළ කළමනාකරණය, වාහන නැවැත්වීම හා දැන්වීම් පුවරු සම්බන්ධ ගැටලු කෙරෙහි විශේෂ අවධානය යොමු කර කටයුතු කරන ලෙසත්,<br><br>කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 06 | **මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් Winching Machine යන්ත්‍රය ප්‍රායෝගිකව භාවිතා කළ නොහැකි බව හා එය නිශ්ක්‍රීයව පැවතීම**<br><br>පූර්ව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ද සාකච්ඡාවට ලක් කළ මෙම කරුණ කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය. | කුඩා යන්ත්‍රයකින් සිදු කළ නොහැකි නල තුළ සිදුවන අවහිරවීමක් (Blockages) යථා තත්ත්වයට පත්කර ගැනීම අවශ්‍යවන අවස්ථාවලදී මෙම යන්ත්‍රය භාවිතා කරන බව කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**නිරීක්ෂණ/ නිර්දේශ**<br><br>එම යන්ත්‍රය ඵලදායී ලෙස යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරක සභාව ග.නි. වෙත නිර්දේශ කළේය. |
| 07 | **මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2වන අදියර Greater Colombo Water & Wastewater Management Improvement Investment Project - GCWWMIIP (Tranche 2&3)** | • උක්ත ව්‍යාපෘතියේ 2 කොටසෙහි (Tranche 2) වටිනාකම ඇ.ඩො.මි. 9ක් බවත්,<br>• ඒ යටතේ ව්‍යාපෘතියේ 3 කොටසෙහි (Tranche 3) සිවිල් කටයුතු (civil works) සඳහා අවශ්‍ය විශේෂඥයන් (Consultants) තෝරා ගැනීම සහ ව්‍යාපෘතියේ ඉතුරු මළ නාලිකා සඳහා CCTV සමීක්ෂණය සිදු කරන බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | • Tranche 3 යටතේ කිරුළපන නල ජලාපවහන කොන්ත්‍රාත්තුව (Kirulapone Pipe Borne Sewer Contract) සහ වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය (Wellawatta Waste Water Treatment Plant) ඇතුළත් වූ බවත්, <br> • වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය අවසන් කර ඇති බවත් (Terminated) එහි network කටයුතු සිදුවෙමින් පවතින බවත්, <br> • කිරුළපන කොන්ත්‍රාත්තුව (Kirulapone Contract) 2025.12. 31 දිනට අවසන් වීමට නියමිත බව හා එහි ඉදිකිරීම් කටයුතු Larsen & Turbo (L & T) නම් කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇති බවත්, <br> • එම කොන්ත්‍රාත්තුවේ සැලසුමෙහි (design) පැවති ගැටලු විසදීමට විශේෂ කමිටුවක් පත්කළ බව හා කොළඹ නගර සභාවේ තාක්ෂණික දැනුම සහිත විශේෂඥයින් කණ්ඩායමක් යොදවා කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් යෝජනාවක් (proposal ) ලබා දෙන ලෙසට කමිටු තීරණයක් ලබා දුන් බවත්, <br> • එම විශේෂඥ කණ්ඩායමේ යෝජනාවලිය පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ ද සාකච්ඡා කර මාස 02ක් තුළ අවශ්‍ය සංශෝධන සිදුකර මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු අවසන් කිරීමට නියමිත බවත්, <br><br> ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 08 | **<u>Greater Colombo Water & Wastewater Management Improvement Investment Project - GCWWMIIP (Tranche 3)</u>** <u>යටතට ගැනෙන යුරෝපානු ආයෝජන බැංකුව</u> **<u>(European Investment bank)</u>** <u>ප්‍රදානය කළ යුරෝපීය ණය ආධාර මුදල යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය</u> | • "Kirula and Narahenpita Sewer Network" ව්‍යාපෘතිය, මේ යටතේ ක්‍රියාත්මක බවත්,<br>• Power China Zhongnan Engineering Cooperation Ltd වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ බවත්,<br>• 2023.11.29 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ බව හා තව මාසයක් ඇතුළත වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත්,<br>• 2026.06.27 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත බවත්,<br>• යුරෝපීය ණය ආධාර මුදල යටතේ ක්‍රියාත්මක "Southern Catchment Sewer Upsizing" ව්‍යාපෘතිය සඳහා අවම ලංසුව ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුගේ ගැටළුවක් හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකළ බව හා නැවත ටෙන්ඩර් කැඳවීමට යෝජිත බවත්,<br><br>ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු කොළඹ මහා නගර සභාවේ අභ්‍යන්තර විගණකවරයාගේ අධීක්ෂණයට ලක් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළ අතර, මීට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති නගර සභා කාර්යය මණ්ඩලයේ ගෙවීම් කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙසද කාරක |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | | සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දුන්නේය.<br>කොළඹ මහා නගර සභාව 2024 මැයි මාසයේ දී නැවත කාරක සභාව හමුවට කැඳවන බව කාරක සභාව දන්වා සිටියේය. |
| **සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ නරක් වූ මාළු අඩංගු බහාලුම් සහිත නැවක් කොළඹ වරායෙන් රට තුළට ගැනීම පිළිබඳ විගණන විමසුමෙන් හෙළිදරව් වූ කරුණු පරීක්ෂා කිරීම**<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 මාර්තු 20** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>❖ පරිසර අමාත්‍යාංශය<br>❖ ශ්‍රී ලංකා රේගුව<br>❖ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව<br>❖ මධ්‍යම පරිසර අධිකාරිය<br>❖ පොලිස් දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පත් කරන කමිටුව</u>**<br>2024.01.23 වන දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව කැඳවූ අවස්ථාවේදී, කාරක සභාව විසින් ඉහත කී විගණන විමසුමට අදාළව ඉවතලන මාළු කොටස් යොදා ගෙන පොහොර නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබන අදාළ කර්මාන්තශාලා විසින් මේ වන විට කොපමණ ප්‍රමාණයක පොහොර නිෂ්පාදනය කර තිබේද යන්න පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙස ලබා දුන් නිර්දේශයට අදාළව | එක් එක් ආයතන වෙතින් කමිටු සමාජිකයන්ගේ නාම යෝජනා ලබා දීම ප්‍රමාද වූ නිසා කමිටුව පත් කිරීමට වැඩි කාලයක් ගත වූ බවත්, දැනට පත් වීමේ ලිපි නිකුත් කර නොමැති බවත් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරිය ප්‍රකාශ කළාය.<br><br>**ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා පත් කරන ලද කමිටුව විසින් 2024.03.25, 2024.04.29 හා 2024.04.30 යන දිනයන්හිදී ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කර සකස් කරන ලද අවසන් වාර්තාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/I&E/Rotten fish/2024 හා** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | එම කමිටුව නම් කිරීම පමණක් සිදු කර තිබූ අතර එසේ නම් කිරීම සිදු කර තිබුණේ ද මෙම රැස්වීම කැඳවීමෙන් අනතුරුව දිනක බව නිරීක්ෂණය කළ කාරක සභාව එම ප්‍රමාදය සඳහා හේතු, අදාළ කමිටුවේ කාර්ය භාරය සහ පත් වීමේ ලිපි නිකුත් කර තිබුණේ ද යන්න පිළිබඳව විමසීය. | **2024.06.11 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇත.** |
| 02 | **<u>මෙම සිදුවීම සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු</u>** | ▪ අදාළ නෞකාව තුළ මාළු බහාලුම් 102 ක් වූ අතර ඉන් 4 ක් Agri star Compost (Pvt) Ltd. ආයතනය වෙත විනාශ කිරීමට නිකුත් කර තිබූ බවත් මෙම බහාළුම් 4 රට තුළට ගැනීමට ව්‍යාජ රේගු සටහන් (Dummy Cusdec) යොදා ගත් බව කාරක සභාව හමුවේ අනාවරණය විය.<br><br>• මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන සහ මෙම බහාළුම් විනාශ කිරීමට සම්බන්ධ වූ පාර්ශවයේ (Destruction Party) අනුමැතිය මත මෙම බහාළුම් 4 විනාශ කිරීමට කටයුතු කළ බව හා ඒවාට අදාළ වාර්තා ඇති බවත්,<br>• Echo N Rich ආයතනය විසින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කළ ඉල්ලීමකට අනුව ඉතිරි බහාළුම් 98 ශ්‍රී ලංකා රේගුව විසින් පත් කරන ලද කමිටුවක් විසින් පරීක්ෂා කර බැලූ බවත්,<br>• එහිදී එය අපමාළු (fish Waste) ලෙස හඳුනාගෙන HS code නිකුත් කළ බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.<br><br>▪ මෙම බහාළුම් 102 න් 98 ක් සඳහා විධිමත් රේගු සටහන්කර (cusdecs) 17 ක් නිකුත් කර තිබූ අතර එම බහාළුම් ලංකාවට ආනයනය කරන ආකාරයෙන් පෙරදාතම් කරන ලද ව්‍යාජ ඉන්වොයිස් සහ ඇසුරුම් ලේඛන (Packing list) ඉදිරිපත් කර තිබූ බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. මෙවැනි ව්‍යාජ ලේඛන මත අදාළ බහාළුම් රට තුළට ගැනීමට අවසරය ලබා දුන්නේ කවුරුන් විසින් ද යන්න කාරක සභාව විමසීය.<br><br>• ශ්‍රී ලංකා රේගුව විසින් පත් කළ කමිටුව හරහා අදාළ අනුමැතිය ලබා දී ඇති බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>▪ අදාළ ආයතනයට එතරම් විශාල මාළු තොගයකින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ධාරිතාවයක් ඇති බවට සහතිකය ලබා දී ඇත්තේ කවුරුන් විසින් ද යන්න කාරක සභාව විමසීය.<br><br>• මෙම බහාළුම් 98 පිළිබඳ අදාළ ආයතනය වෙතින් කාබනික පොහොර සකස් කිරීමේ ක්‍රමවේදය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | පිළිබඳ යෝජනාවලියක් ලබා ගැනීමෙන් අනතුරුව පරීක්ෂා කිරීම් කර බලා අනුමැතිය ලබා දුන් බව පරිසර අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ</u>**<br><br>• එම ආයතනයට පොහොර නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතිකයක් ලබා දුන්න ද සත්‍ය වශයෙන් ම එවැනි ධාරිතාවයක් නොමැති නිසා බහාළුම් 43 ක් පමණ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගත්ත ද බහාළුම් 40 ක් ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කිරීම සහ එම ආයතනය සැමන් නිෂ්පාදනය කිරීම ද සිදු කරන බැවින් මෙම නරක් වූ මාළු තොග ඒ සඳහා යොදා ගැනීමට ඔවුන්ට ලබා දුන්නා ද යන්න ගැටළු සහගත බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි.<br>• රේගු ආඥා පනතේ ප්‍රතිපාදන අනුව, නරක් වූ මාළු ලංකාවට ගොඩබෑම කළ නොහැකි බව ද විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදි.<br><br>අප මාළු (Fish Waste) යන්න ආනයන අපනයන පාලන පනත යටතේ බලපත්‍ර පාලනයට යටත් භාණ්ඩයක් පමණක් වන අතර එය තහනම් භාණ්ඩයක් නොවන බවත් ඉන්වොයිසිය, ශ්‍රී ලංකා රේගුව විසින් පත් කළ කමිටු වාර්තාව සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ යන අදාළ ලේඛන සමඟ Echo N Rich ආයතනය විසින් බහාළුම් තුළ තිබූ අප මාළු භාවිතා කර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කාබනික පොහොර සැදීමට කළ විධිමත් ඉල්ලීමක් මත අදාළ බලපත්‍රය නිකුත් කළ බව ආනයන අපනයන පාලක ජනරාල්වරිය ප්‍රකාශ කළාය.<br>මෙම බහාළුම් 98 න් ඉතිරි බහාළුම් 15 වෙනත් ආයතනයක් විසින් පොහොර නිෂ්පාදනයට යොදාගැනීමට කටයුතු කරන බවත් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අපේක්ෂාවෙන් සිටින බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ ග.නි ප්‍රකාශ කළේය. |
| 03 | **<u>මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි</u>** | සිවිල් වැසියෙකු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අනුව විමර්ශන කටයුතු සිදු කරගෙන ගිය බවත් ඔහු විසින් තව දුරටත් විමර්ශන කටයුතු කිරීම අනවශ්‍ය බව ප්‍රකාශ කළ බැවින් විමර්ශන කටයුතු නතර කළ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදි.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙම ගැටළුව සම්බන්ධයෙන් 2024.03.22 වන සිකුරාදා දිනට පෙර අදාළ නීත්‍යානුකූල පියවරයන් අනුගමනය කරමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙසත්, මෙම ගැටළුව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිත වාර්තාවක් 2024.03.27 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් කාරක සභාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | | පැමිණිල්ල ලද පසු කඩිනමින් (මාස 2 -3 ඇතුළත) පරීක්ෂණ කටයුතු සිදු කරන ලෙසත් 2024.04.20 වන දිනට පෙර මේ සම්බන්ධයෙන් ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.<br><br>**නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක සී/139/23 සී හා 2024.05.31 දිනැති ලිපිය මගින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අදාළ පැමිණිල්ල ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශ නිලධාරීන් වෙත දිනයක් හා වේලාවක් ලබාදෙන ලෙස අධ්‍යක්ෂ - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත.**<br><br>**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ** අධ්‍යක්ෂගේ අංක **PA/DCI/V/GP/1382/ 2024** හා **2024.07.05** දිනැති ලිපියෙන් අදාළ පැමිණිල්ල සටහන් කර ගැනීම සඳහා **2024.06.26** වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ලෙසට දුරකථනය මගින් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා ඇත.<br><br>**විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මෙතෙක් ඉදිරිපත් කර නොමැත.** |
| **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව** | | |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td colspan="3">(ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් 2020, 2021 සහ 2022 මුදල් වර්ෂ සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීම)<br>විමර්ශනය කරන ලද දිනය - 2024 අප්‍රේල් 02</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ මහජන ආරක්ෂක අමාත්‍යාංශය<br>❖ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>01</td><td><u>ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම</u><br><br>මෙම දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ආපන ශාලාව, ඡායාරූප ශාලාව, සේවා පියස ආදියෙන් ලැබෙන ආදායම් සුභ සාධක සංගමයේ ගිණුමට බැර කරනු ලබන බවත්, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා ගෙන නොමැති බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.</td><td>2007.07.22 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ලබා දුන් නිර්දේශය ප්‍රකාරව, දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති ආපන ශාලාව, ඡායාරූප ශාලාව, සේවා පියස ආදියෙන් ලැබෙන ආදායමෙන් 25% ක ප්‍රමාණයක් වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන බවත්, ඉතිරි මුදල සුබසාධක සංගමයේ ගිණුමට බැර කරනු ලබන බවත් ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි සඳහන් කර සිටියේය.<br><br><u>නිර්දේශ</u><br><br>දෙපාර්තමේන්තුවේ සුභ සාධක අරමුදල නීත්‍යානුකූල කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් කාරක සභාව, මෙම අරමුදලට ආදායම් ලැබෙන ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි) වෙත නිර්දේශ කළේය.<br><br>මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | හා **2024.05.14** දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.<br><br>එම වාර්තාවට අනුව සුහසාධක අරමුදලට ආදායම් ලැබෙන මූලාශ්‍ර -<br><br>• සාමාජික ගාස්තු<br>• අවමංගල්‍යාධාර ගාස්තු<br>• සේවා පියස මගින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ලැබෙන ආදායම<br>• විශේෂ වෙළෙඳ කුටි ආදායම<br>• ආපන ශාලාවේ ලාභය |
| 02 | **<u>විද්‍යුත් ගමන් බලපත්‍රය (e-passport) නිකුත් කිරීම</u>** | විද්‍යුත් ගමන් බලපත්‍රයක් මගින් පුද්ගලයකුගේ අනන්‍යතාවය ක්ෂණිකව හඳුනා ගැනීමට හැකි වන බවත්, ගුවන් තොටුපල තුළ පවත්නා තදබදය අවම කිරීමට ද එමගින් හැකි වන බවත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරි (ග.නි) සඳහන් කළේය. ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු මේ වනවිට සිදු කර ඇති බැවින් ඉතා ඉක්මණින් විද්‍යුත් ගමන් බලපත්‍රය නිකුත් කිරීමට හැකි වනු ඇති බව ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>විද්‍යුත් විදේශ ගමන් බලපත්‍ර (E-passport) නිකුත් කිරීම සම්බන්ධ වර්තමාන තත්ත්වය සහ මෙම ක්‍රියාවලිය අවසන් කිරීම දක්වා දින වකවානු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **හා 2024.05.14 දිනැති ලිපිය මගින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 03 | **<u>e-gates ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම</u>**<br><br>අවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සිදු කිරීමට පෙර පරීක්ෂා කිරීම් සඳහා අදාළ නිලධාරියකු යොමු කිරීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් කාරක සභාවේ දැඩි අප්‍රසාදය පළ විය. | එම ප්‍රමාදයට හේතුව අදාළ නිලධාරියා විද්‍යුත් ගමන් බලපත්‍රය නිකුත් කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතුවල යෙදී සිටීම බවත්, 2024 අප්‍රේල් මස අවසන් වීමට පෙර අදාළ පරීක්ෂා කිරීම් සිදුකර 2024 ජූලි මාසය වනවිට e-gates 4 ක් ලබා ගැනීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>ගුවන් තොටුපල තුළ සිදු වන තදබදය වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත E-gates ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු සහ ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දින වකවානු ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**<br><br>**අදාළ වාර්තාව අනුව 2024.05.12 දින පාලක ජනරාල් හා අදාළ තාක්ෂණික කණ්ඩායම E-gates පරීක්ෂා කිරීම සඳහා (Factory Acceptance Test) සහභාගි වී ඇති අතර ප්‍රමාදයකින් තොරව මෙම ව්‍යාපෘතිය අවසන් කළ හැකි බව දැනුම් දී ඇත.** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 04 | **<u>ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය ඵලදායි ලෙස සේවයේ යෙදවීම.</u>**<br><br>ගුවන් තොටුපල තුළ පවතින තදබදය වළක්වා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. විශේෂයෙන් කාර්ය බහුල අවස්ථාවන්හි සේවා කවුළු ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක නොවීම නිසා මගීන් දැඩි අපහසුතාවයට පත්වන බව මෙහිදී අනාවරණය වූ අතර, ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය සේවා මුර (Duty Roster) සඳහා අනුයුක්ත කරන ආකාරය පිළිබඳව කාරක සභාව විමසා සිටියේය. | සේවා කවුළු සඳහා යෙදවීමට ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැතිවීම ගැටළුවක් වී ඇති බව මෙහිදී ප්‍රකාශ වූ අතර, ගුවන් තොටුපල බලයලත් නිලධාරීන්ගේ අනුමත කාර්ය මණ්ඩලය (Approved Cadre) 458 ක් බවත්, ඒ අතරින් දැනට සිටින 430 ක් වූ නිලධාරීන්ගෙන් 250 ක් කටුනායක ගුවන් තොටුපල සේවය සඳහා යොදවා ඇති බව ග.නි. සඳහන් කර සිටියේය. ඒ අතරින් දිවා සහ රාත්‍රී සේවා මුර සඳහා නිලධාරීන් 55 බැගින් අනුයුක්ත කරන බව ද මෙහිදී අනාවරණය විය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>ගුවන් ගමන් කාල සටහන අනුව කාර්ය බහුල අවස්ථාවන් සඳහා වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කළ කාරක සභාව, සේවා මුර (Duty Roster) සකස් කිරීමේදී, දැනට ක්‍රියාත්මක වන ආකාරයට දිවා සහ රාත්‍රී සේවා මුරයන් සඳහා සමාන සේවක පිරිස් යෙදවීම වෙනුවට ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය වඩාත් ඵලදායි ලෙස යොදවා ගැනීම සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**<br><br>**ඒ අනුව, පැය 24 ක සේවා කාලයක් සඳහා නිලධාරීන් 133 ක් අවම වශයෙන් අවශ්‍ය** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **වුවත්, නිලධාරි හිඟය නිසා එම ප්‍රමාණය සේවයේ යෙදවීම ප්‍රායෝගිකව කළ නොහැකි බවත්, දැනට සිටින නිලධාරීන් කළමනාකරණය කර ගනිමින් දිවා කාලයට වඩා වැඩි පිරිසක් රාත්‍රී සේවා මුර සඳහා යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.** |
| 05 | **<u>Henley Passport Index ශ්‍රේණිගත කිරීම</u>** | මෙම ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය 83 වැනි ස්ථානයේ පවතින බව කාරක සභාව හමුවේ අනාවරණය විය. මෙම ශ්‍රේණිගත කිරීමේදී සලකා බලනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ එම ගමන් බලපත්‍රය මගින් වීසා රහිතව (Visa Free) සංචාරය කළ හැකි රටවල් සංඛ්‍යාව බව මෙහිදී අනාවරණය විය. දැනට ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය මගින් වීසා නොමැතිව සංචාරය කළ හැකි රටවල් සංඛ්‍යාව 41 ක් බව ද, එම සංඛ්‍යාව තවදුරටත් වැඩි කර ගැනීම තුළින් ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය මෙම ශ්‍රේණිගත කිරීමේ ඉදිරියට ගෙන යා හැකි බව ද ප්‍රකාශ විය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>මෙම ශ්‍රේණිගත කිරීමේ එක් එක් නිර්ණායක වලට අදාළව, ශ්‍රී ලංකාව දැනට සිටින තත්ත්වය සහ පවත්නා තත්ත්වය දියුණු කර ගැනීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අතිරේක පාලක ජනරාල් ගේ ප්‍රධානත්වයෙන් යුත් පංච පුද්ගල කමිටුවක් 2024.05.10 දින පත්කර ඇති බවත්, කමිටු වාර්තාව මාස 4 ක කාලයක් තුළ ඉදිරිපත් කරන බවත් දැනුම් දී ඇත.** |
| 06 | <u>ප්‍රාදේශීය කාර්යාලවල තත්ත්වය</u><br><br>විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ස්ථාපිත කර ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල තත්ත්වය ඉතාමත් අසතුටුදායක මට්ටමක පවතින බව කාරක සභාව සඳහන් කළේය. | මේ වනවිට මාතර, මහනුවර, කුරුණෑගල සහ වව්නියාව යන නගර කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාදේශීය කාර්යාල 4 ක් පිහිටුවා තිබෙන බව සඳහන් කළ ග.නි., ඇතැම් ප්‍රාදේශීය කාර්යාලවල ජනතාවට ප්‍රමාණවත් පහසුකම් නොමැති බව පිළිගන්නා බව ප්‍රකාශ කළේය. මාතර කාර්යාලය පහසුකම් සහිත වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙන බවද ග.නි. සඳහන් කළේය. |
| 07 | <u>විදේශිකයින් මෙරට ව්‍යාපාර කටයුතුවල නිරතවීම</u><br><br>සංචාරක වීසා (Visit Visa) මත මෙරට රැඳී සිටින විදේශීය ජාතිකයින් විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට ව්‍යාපාර කටයුතුවල යෙදීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ දකුණු පළාත ආශ්‍රිතව මෙවැනි කටයුතු බහුලව සිදු වන බව පෙන්වා දුන් | මෙම තත්ත්වය සම්බන්ධයෙන් තම දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇති බවත්, ඒ සඳහා වෙනම විමර්ශන කණ්ඩායමක් යොදවා ඇති බවත් ග.නි. විසින් සඳහන් කරන ලදී. එවැනි පුද්ගලයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන ඔවුන්ගේ රටවලට පිටත් කර යැවූ බවද ඔහු වැඩිදුරටත් සඳහන් කළේය. විශේෂයෙන් රුසියානු හා යුක්රේන ජාතිකයින්ට ලබා දුන් වසර 2 ක වීසා සහනය අයථා ලෙස භාවිත කරමින් ඔවුන් විසින් වැඩි වශයෙන් මෙවැනි කටයුතු සිදු කරනු ලබන බව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | කාරක සභාව, කඩිනමින් මෙවැනි කටයුතු නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව අවධාරණය කළේය. | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ග.නි. පෙන්වා දුන්නේය.<br><br>ඊට අමතරව, මෙවැනි පුද්ගලයින්ගෙන් විවිධ ලෙඩ රෝග රට තුළ ව්‍යාප්ත වීමේ අවදානමක් පිළිබඳව ද කාරක සභාව අවධාරණය කළේය. විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ රැඳී සිටින ඉන්දීය ජාතිකයින්ගෙන් ක්ෂය රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් පවතින බව මෙහිදී අනාවරණය විය.<br><br>පරිගණක දත්ත පද්ධතිය මගින් එවැනි පුද්ගලයින් හඳුනා ගැනීම සිදු කරන නමුත්, පරීක්ෂා කිරීමට යාමේදී ඔවුන් විසින් ලබා දී ඇති ලිපිනයන්හි ඔවුන් රැඳී නොසිටීම තම නිලධාරීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් බව ග.නි. ප්‍රකාශ කළේය. දත්ත පද්ධතියට අනුව මේ වනවිට වීසා නොමැතිව මෙරට රැඳී සිටින විදේශීය ජාතිකයින් සංඛ්‍යාව 2400 ක් පමණ වන බව මෙහිදී අනාවරණය විය.<br><br>මෙවැනි කටයුතු පාලනය කිරීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු බව අවධාරණය කළ කාරක සභාව, ඒ සඳහා ජනතා සහය ලබාගත යුතු බව සඳහන් කළේය. මෙවැනි කටයුතු පිළිබඳව දැනුම්දීම සඳහා ජනතාවට ක්ෂණික ඇමතුම් අංකයක් (Hotline) හඳුන්වා දීම හා පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වෙනමම ඒකකයක් පිහිටුවීම වැනි කටයුතු සිදු කළ හැකි බව ද, කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 08 | <u>**දිරි දීමනා ගෙවීම**</u><br><br>ගුවන් තොටුපල සේවකයින් වෙත ගෙවනු ලබන දිරි දීමනා මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්ව සිදු කළ යුතු බවට අදාළ චක්‍රලේඛයේ සඳහන් වුවද, එවැනි අනුමැතියක් ලබාගත් බවට නිරීක්ෂණය නොවන බව විගණකාධිපතිවරයා සඳහන් කළේය. | මේ සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් මේ වනවිට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ බලතල ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා ඇති බැවින් මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශන්ට යටත්ව අදාළ අනුමැතිය සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව ග.නි. සඳහන් කළේය.<br><br><u>**නිර්දේශ**</u><br><br>දැනට ඇති දිරි දීමනා ක්‍රමය පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මගින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 09 | <u>**CCTV කැමරා 62 ක් 2017 වසරේ සිට භාවිතයට නොගෙන ගබඩා කර තැබීම**</u><br><br>රුපියල් මිලියන 2 කට අධික වටිනාකමින් යුත් CCTV කැමරා 62 ක් මිලදී ගෙන වසර 6 ක් තිස්සේ සවි නොකර තබාගෙන සිටීමට හේතු කවරේද යන්න කාරක සභාව විසින් විමසන ලදී. | මෙම මිලදී ගැනීම් සිදු කර ඇත්තේ 2017 වර්ෂයේ බවත්, එම මිලදී ගැනීම් වලට සම්බන්ධ නිලධාරීන් කිසිවකු අද වනවිට දෙපාර්තමේන්තුවේ නොමැති බවත් සඳහන් කළ ග.නි., මෙම කැමරා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පරිශ්‍රයේ සවි කිරීම සඳහා මිලදී ගෙන ඇති බවත්, මෙම පද්ධතිය සම්පූර්ණ වීම සඳහා තවත් උපකරණ කීපයක් මිලදී ගත යුතුව ඇති බවත් ප්‍රකාශ කළේය. ඒ සඳහා මේ වසරේ ප්‍රතිපාදන වෙන්කර ඇති බවද ඔහු සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | <u>නිර්දේශ</u><br><br>CCTV කැමරා 62 ක් වසර 6 ක් තිස්සේ භාවිතයට නොගෙන ගබඩා කර තැබීම පිළිබඳව බලවත් අප්‍රසාදය පළ කළ කාරක සභාව, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීගෙන් සමන්විත කමිටුවක් පත්කර මෙම කැමරා සවි කිරීම සඳහා සැලැස්මක් සකස් කොට, එම සැලැස්මට අනුව තවදුරටත් අවශ්‍ය උපකරණ මොනවාද යන්න සොයා බලා, මෙම කැමරා සවිකර අවසන් කරනු ලබන දින වකවානු ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24**<br><br>**හා 2024.05.14 දිනැති ලිපිය මගින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 10 | **<u>හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීම එකම ආයතනයක් මගින් සිදු කිරීම</u>**<br><br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් වසර 21 ක් තිස්සේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව එකම ආයතනයකින් හිස් ගමන් බලපත්‍ර ලබා ගන්නා බව කාරක සභාව අනාවරණය කළේය. එසේම, හිස් ගමන් බලපත්‍රවල අවශ්‍යතාව සැලකිල්ලට නොගෙන | ටෙන්ඩර් කැඳවා නව සැපයුම්කරුවකු තෝරා ගැනීමට අවස්ථා කීපයකදී උත්සාහ කළ නමුත් ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී උද්ගත වූ යම් යම් කරුණු නිසා එම උත්සාහයන් සාර්ථක නොවූ බව ග.නි. සඳහන් කර සිටියේය.<br><br>මේ වනවිට හිස් ගමන් බලපත්‍ර මිලියන 5 ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති බවත් ග.නි. වැඩි දුරටත් සඳහන් කර සිටියේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | සිදුකර ඇති මෙම මිළදී ගැනීම බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයට ද හේතුවක් වී තිබෙන බව කාරක සභාවේදී අනාවරණය විය. | |
| 11 | <u>ගමන් බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම</u><br><br>2024 පෙබරවාරි 01 දින සිට සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තුව රු.5,000/- සිට රු. 10,000/- දක්වා වැඩි කිරීමේදී පනත ප්‍රකාරව කටයුතු කර නොතිබීම කෙරෙහි කාරක සභාවේ අවධානය යොමු විය. | එවැනි ගාස්තු සංශෝධනයක් සිදු කිරීමට මූලික හේතුව වශයෙන් ප්‍ර.ග.නි./ ග.නි. පෙන්වා දුන්නේ අවශ්‍යතාවයක් නොමැතිව ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සීමා කිරීම බවයි. ගමන් බලපත්‍ර ලබා ගන්නා පුද්ගලයින් අතරින් විදේශගත වන්නේ 23% ක් පමණක් බව අනාවරණය වී ඇති බව ද හෙතෙම පෙන්වා දුන්නේය. |
| 12 | <u>නීති විරෝධීව රට තුළට පැමිණෙන අය රඳවා තබන ස්ථාන</u> | ඒ සඳහා 100 දෙනෙකුට පහසුකම් සහිතව වැලිසර ප්‍රදේශයේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවත්, රාගම ප්‍රදේශයේ අක්කර 2ක ඉඩමක් මේ වනවිට ලබා ගෙන ඇති අතර, එහි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යෝජිත බවත් ග.නි. සඳහන් කර සිටියේය. |
| 13 | <u>කටුනායක ගුවන් තොටුපල තුළ CCTV කැමරා සවි කිරීම</u> | <u>නිර්දේශ</u><br><br>කටුනායක ගුවන් තොටුපල පර්යන්තයේ මගී තොරතුරු ලබා ගැනීම සඳහා කවුන්ටර වල සවි කිරීමට යෝජිත CCTV කැමරා පද්ධතිය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් 2024 මැයි 15 දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කළේය. |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td></td><td></td><td>මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PS/IA/E&I/109/02/24 හා 2024.05.14 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.<br><br>කටුනායක ගුවන් තොටුපල පර්යන්තයේ සියලු පරිපාලන කටයුතු සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන බැවින් මගී තොරතුරු ලබා ගැනීම සඳහා CCTV සවිකිරීමේ බලයක් ආගමන විගමන දෙපාර්තමේන්තුවට නොමැති බව උක්ත වාර්තාව මගින් දැනුම් දී ඇත.</td></tr>
<tr><td colspan="3">අධ්‍යාපන අමාත්‍යාංශය<br>(ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (NEMIS) ප්‍රගතිය, 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)<br>විමර්ශනය කරන ලද දිනය - 2024 අප්‍රේල් 24</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ අධ්‍යාපන අමාත්‍යාංශය<br>❖ මොරටුව විශ්වවිද්‍යාලය<br>❖ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)</td></tr>
<tr><td>01</td><td><u>ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) යාවත්කාලීන කිරීම</u><br><br>ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) පිළිබඳව වසර 04 ක පමණ සිට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවට ලක් කරන ලද නමුත් මේ දක්වා එහි සාධනීය ප්‍රගතියක් දක්නට නොලැබෙන බව</td><td>• මෙම දත්ත පද්ධතිය මගින් යාවත්කාලීන තොරතුරු ලබාගත නොහැකි වීම හේතුවෙන් එය අසාර්ථකව ඇති බව<br>• අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික දත්ත පදනමක් නොමැතිව තීරණ ගැනීමට නොහැකි වීම අධ්‍යාපන අමාත්‍යාංශයේ බොහෝ ගැටළු ඇතිවීමට හේතු වී ඇති බව<br>• මොරටුව විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ඇතුළු අදාළ</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ප්‍රකාශ කළ කාරක සභාව නිසි දත්ත පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් ගුරුවරුන් හා සිසුන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දැඩි අපහසුතා පවතින බව පෙන්වා දුන්නේය. | සියලු ආයතන සම්බන්ධ කරගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය ද සමග මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව<br>ප්‍ර.ග.නි./ග.නි., ප්‍රකාශ කළාය.<br>එසේම,<br>• තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේදී එහි තාක්ෂණික හැකියාව මෙන්ම ඊට අදාළ පරිපාලනමය ක්‍රියාදාමයක් පැවතීම ද අවශ්‍ය බව<br>• මෙම දත්ත පද්ධතිය ව්‍යාපෘතියක් මගින් ක්‍රියාත්මක වූ බැවින් එම ව්‍යාපෘතිය අවසන් වූ පසුව දත්ත පද්ධතිය තිරසරව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවේදයක් නොපැවති බව<br>• පරිපාලනමය ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් දත්ත පද්ධතියේ තිබෙන දත්ත නිරතුරුව යාවත්කාලීන නොවීම, NEMIS දත්ත පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම කෙරෙහි බලපාන ලද බව<br>• තොරතුරු තාක්ෂණ පද්ධතිවල මෘදුකාංග සඳහා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම් සිදු වන බැවින් දත්ත පද්ධතියක් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ ව්‍යූහ (IT infrastructure) පිළිබඳව වෙනම අංශයක් පැවතිය යුතු බව<br>මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කළ මහාචාර්යවරු ප්‍රකාශ කළහ.<br>මෙම පද්ධතිය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම් |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | | සහ අවශ්‍ය සුදුසුකම් සහිත තොරතුරු තාක්ෂණ නිලධාරීන් දැනට අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැති බවත්, සුහුරු පන්ති කාමර (Smart Classrooms) සියයක් හා කෘත්‍රිම බුද්ධි සමාජ (AI Club) සියයක් ස්ථාපනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද මෙම පහසුකම් ප්‍රමාණවත් නොවීම බලපා ඇති බවත් ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ග.නි, නව දත්ත පද්ධතියක් කරා යොමුවීම සුදුසු වන බව සඳහන් කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>• රාජ්‍ය ආයතනවල තොරතුරු පද්ධති ස්ථාපනය කිරීමේදී එම පද්ධති තිරසරව පවත්වාගෙන යාම පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු නොකිරීම හේතුවෙන් මෙවැනි ගැටළු ඇති වන බව නිරන්තරයෙන් නිරීක්ෂණය වී ඇති බව,<br>• පසුගිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම දත්ත පද්ධතිය සඳහා අවශ්‍ය දෘඩාංග නොමැති බව ප්‍රකාශ කළ බව හා මේ වන විට රුපියල් මිලියන 125 ක් වටිනා දෘඩාංග මිලදී ගෙන ඇති බව,<br>• දත්ත පද්ධති වෙත යොමු වීම කෙරෙහි ඇතැම් නිලධාරීන් අකමැත්තක් දැක්වීමද ගැටළුවක් වී ඇති බව,<br><br>කාරක සභාව පෙන්වා දුන්නේය .<br><br>මෙම පද්ධතිය තවදුරටත් පවත්වාගෙන යන්නේද නැතහොත් නව පද්ධතියක් ස්ථාපනය කරන්නේද යන්න පිළිබඳ තීරණය කර, ඒ අනුව ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල පිළිබඳව එහි ආරම්භක හා අවසාන දින වකවානු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් 2024.05.17 දින වන විට කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන් විෂය භාර ගරු අමාත්‍යවරයා සමග සාකච්ඡා කර පළාත් සභා සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ද සම්බන්ධ කරගනිමින් කමිටුවක් පත්කොට සතියක් තුළ අදාළ මූලික සාකච්ඡාවන්/ දැනුවත් කිරීම් සිදු කර අවශ්‍යතාවය පරිදි අනුමැතියන් ලබාගැනීමට හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසත් ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**දැනට පවතින ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) වර්තමාන දත්ත අවශ්‍යතා සඳහා නොගැළපීම හා එහි පවතින තාක්ෂණික ගැටළු හේතුවෙන් ඉදිරියට පවත්වාගෙන යා නොහැකි බවත්, CODEGEN ජාත්‍යන්තර සමාගම විසින් ඉදිරි වසර 05 ක් දක්වා ආයතන සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතියක් ලෙස කිසිදු ගෙවීමකින් තොරව නව කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර දීමට එකඟ වී ඇති බවත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/05/90/Audit/COPA/2024 හා 2024.05.20 දිනැති ලිපියෙන් දන්වා ඇත. (ඇමුණුම III)** |
| 02 | **<u>1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත යටතේ රජයට පවරා ගෙන ඇති ඇතැම්</u>** | • මෙම කරුණ සම්බන්ධයෙන් දැනට පාසල් 163 ක තොරතුරු ගෙන්වා ගෙන අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බවත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **<u>පාසල්වල ඉඩම් හා දේපළ පිළිබඳ නිශ්චිත තොරතුරු අමාත්‍යාංශය සතුව නොපැවතීම</u>**<br><br>මෙම පනත ප්‍රකාරව රජයට පවරාගත් පාසලක් වැසී ගියහොත් එහි දේපළ මුල් අයිතිකරුවන් වෙත නැවත ලබා දිය යුතු නමුත්, එලෙස කටයුතු නොකරන ලද බස්නාහිර පළාතට අයත් පාසල් 284 ක් පවතින බව කාරක සභාවේදී අනාවරණය විය. | • අදාළ ගැසට් පත්‍රය අනුව පාසල් 2652 ක් පවරාගෙන ඇති නමුත් අවශ්‍යතාවය පරිදි ක්ෂේත්‍ර පරීක්ෂණ හා අනෙකුත් කටයුතු සිදු කරනු ලබන බවත්, සහ<br>• අවශ්‍ය අවස්ථාවලදී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් පිඹුරුපත්, ඉඩම් ප්‍රමාණ ඇතුළු අනෙකුත් සියලු විස්තර ලබාගන්නා බවත්<br><br>ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>• කිසිදු ලියවිල්ලක් හෝ ස්ථිර පිඹුරක් නොමැති පාසල් රැසක් පවතින බව හා මෙවැනි පාසල්වල දේපළ සම්බන්ධයෙන් ගැටළු රැසක් පවතින බව,<br>• ඉදිරි වසර 5 තුළ වැසී යාමට නියමිත පාසල් සංඛ්‍යාව වැනි වැදගත් සංඛ්‍යාත්මක තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොපවතින බව,<br>• අධ්‍යාපන අමාත්‍යාංශය සතු සියලුම පාසල්වල දේපළ පිළිබඳ තොරතුරු තිබිය යුතු බව,<br>• ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ විජේරාම විද්‍යාලය හා ස්ටැන්ලි තිලකරත්න විද්‍යාලය යන පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා අඩු අගයක පවතින බව හා එම පාසල්වල විශාල ඉඩම් හා ගොඩනැගිලි සංඛ්‍යාවක් නිසි ලෙස ප්‍රයෝජනයට නොගෙන පවතින බව,<br>• ඇතැම් පාසල්වල දේපළ, වංචා සහගතව බාහිර පාර්ශ්ව විසින් ලබාගැනීමට උත්සාහ දරන අවස්ථා පවතින බව, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | • පාසල්වල නිශ්චිත තොරතුරු නොමැති වීම හේතුවෙන් වැසී යන පාසල්වල දේපළ වෙනත් පොදු කාර්යයන් සඳහා යොදාගැනීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේ ක්‍රියාමාර්ගයකට යොමුවීමට හෝ නොහැකි වන බව,<br><br>කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත ප්‍රකාරව රජයට පවරාගත් පාසල්වල දේපළ අවසතු කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යවරයා සතු වන බව ද මෙහිදී සඳහන් කෙරිණි.<br><br>1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත යටතේ රජයට පවරා ගෙන ඇති පාසල් හා එම පාසල් අතරින් රේඛීය අමාත්‍යාංශයට අයත් වන පාසල් සංඛ්‍යාව සහ එක් එක් පළාත් සභාවට අයත් වන පාසල් සංඛ්‍යාව, ඒවායේ නීතිමය පසුබිම යන තොරතුරු රැස් කරගන්නා ලෙස උපදෙස් දුන් කාරක සභාව, ඒ සඳහා මෙම පනත යටතේ රජයට පවරා ගෙන ඇති පාසල් 2652 සම්බන්ධයෙන් පළාත් සභා හරහා තොරතුරු ලබාගැනීම පිණිස ආකෘති පත්‍රයක් හා උපදෙස් පත්‍රිකාවක් සකස් කර, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ලබාදුන් නිර්දේශයක් අනුව බවට සඳහනක් ඇතිව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත යවා අදාළ තොරතුරු රැස්කර ගන්නා ලෙස උපදෙස් දුන්නේය.<br><br>එසේ ලබාගන්නා තොරතුරු අනුව,<br><br>- මෙම පාසල් අතරින් දැනට පවත්වාගෙන යන පාසල් සංඛ්‍යාව සහ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | එම එක් එක් පාසල්වල වත්කම් හා දේපළ ප්‍රමාණයන්,<br>- මේ වන විට වැසී ඇති පාසල් සංඛ්‍යාව සහ ඒ අතරින් අයිතිය අවසතු කර ඇති පාසල් සංඛ්‍යාව හා භාවිතයට නොගෙන පවතින පාසල් සංඛ්‍යාව,<br>- ඉදිරියේදී වැසීමට නියමිත පාසල් සංඛ්‍යාව සහ ඒවායේ ඉඩම් හා ගොඩනැගිලි/ දේපළ පිළිබඳ තොරතුරු, සහ<br>- පරිත්‍යාග කරන ලද දේපළවල මුල් හිමිකරුවන්/ පරිත්‍යාග කරන අවස්ථාවේ නම් කළ භාරකරුවන් සහ එම නම් කළ භාරකරුවන් ජීවත්ව සිටීද යන්න හා එම දේපළවල වර්තමාන භාරකරුවන්<br><br>පිළිබඳ තොරතුරු ඇතුළත් සම්පිණ්ඩන වාර්තාවක් සකස් කර 2024.06.15 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය. ඉහත තොරතුරු ලබාගැනීමේ ආකෘති පත්‍ර සකස් කිරීමේදී පාසල් කිහිපයක ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම සහ විදුහල්පතිවරුන් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡා පැවැත්වීම සුදුසු බව ද කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අදාළ වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/05/69/01/01/ 700(විවිධ) හා 2024.06.14 දිනැති ලිපියෙන් එවා ඇති අතර තවදුරටත් අදාළ තොරතුරු Google Sheet දත්ත සමුදායක් මගින් අඛණ්ඩව රැස්කරමින් ඉදිරියට පවත්වාගෙන යන බව දන්වා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 03 | **<u>2008.09.18 දිනැති 2008/37 දරන චක්‍රලේඛයට පටහැනිව අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යුහ කමිටු අනුමැතියකින් තොරව පාසල් 29ක විදුහල්පතිවරුන් විසින් අතරමැද පන්ති සඳහා නව පන්ති ආරම්භ කර තිබීම.</u>**<br><br>ඉහත චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යුහ කමිටු අනුමැතියකින් තොරව පාසල්වල සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නොකළ යුතු වුවද, අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව විදුහල්පතිවරුන්ගේ අභිමතය පරිදි පාසල් 29 ක පන්ති සංඛ්‍යාව වෙනස් කර ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. | 2022 වර්ෂයේදී මෙම පන්ති වැඩිකිරීම සිදු කර ඇති බවත්, පාසල් 6ක පන්ති සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ව්‍යුහ කමිටු අනුමැතිය ලබා දී ඇති බවත්, එසේ පන්ති සංඛ්‍යාව වෙනස් කර ඇති බව වාර්තා වූ අනෙකුත් පාසල්වල විදුහල්පතිවරුන්ගෙන් ඒ පිළිබඳව විමසීම් කර ඇති අතර මෙතෙක් එම තොරතුරු ලැබී නොමැති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙම කරුණට සම්බන්ධ එක් එක් පාසල විසින් 2008/37 චක්‍රලේඛයට පටහැනිව ආරම්භ කර තිබූ පන්ති සංඛ්‍යාව හා මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් 2024.05.17 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අදාළ වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/05/90/Audit/ COPA/2024 හා 2024.05.20 දිනැති ලිපියෙන් එවා ඇත. (ඇමුණුම IV)** |
| 04 | **<u>සාමාන්‍ය රාජකාරි වේලාවන්වලදී වැඩමුළු සඳහා සහභාගී වී සහභාගීත්ව දීමනා වෙනුවට සම්පත්දායක දීමනා ගෙවා තිබීම.</u>**<br><br>ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017.04.27 දිනැති අංක EST-EXAMS-05-1007-06 දරන ලිපියේ උපදෙස්වලට පටහැනිව සාමාන්‍ය රාජකාරි වේලාවන්වලදී වැඩමුළු සඳහා සහභාගී වී | සත්‍ය වශයෙන්ම සම්පත්දායක දීමනා ලබාගෙන තිබෙනුයේ චක්‍රලේඛ සකස් කිරීම, පළාත් නවයෙහිම නිලධාරීන්ද සම්බන්ධ කරගත යුතු බිම් මට්ටමේ තීරණ ගැනීම් සඳහා වන බුද්ධි කලම්බන සැසි වැනි සාමාන්‍ය රාජකාරියට පරිබාහිර කටයුතුවල නිරත වූ අවස්ථා වෙනුවෙන් බවත්, ඉදිරියේදී සම්පත්දායක දීමනා ගෙවීම සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | සහභාගීත්ව දීමනා වෙනුවට රුපියල් මිලියන 7ක් පමණ සම්පත්දායක දීමනා ලෙස ගෙවා තිබීම පිළිබඳ කාරක සභාව අවධානය යොමු කළේය . | අධ්‍යාපන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළිබඳව කාරක සභාව විමසන ලද අතර මානව සම්පත් අංශය මගින් සියලුම නිලධාරීන් වෙත කාර්යසාධන ගිවිසුම් හා කාර්යසාධන ඉලක්ක ලබා දීමට කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය. |
| 05 | <u>**පාසල්වලට ඇතුළත් වන නවක සිසුන් සංඛ්‍යාව පහළ යාම**</u> | <u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br><br>මෙම වර්ෂය සඳහා පාසල්වලට නවක සිසුන් ඇතුළත් කිරීමේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව සිසුන් සංඛ්‍යාවේ විශාල අඩුවීමක් වාර්තා වී ඇති බවත්, කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූ තත්ත්වය මත පසුගිය වර්ෂවල උපත් ප්‍රමාණය පහළ යාම හේතුවෙන් ඉදිරි වර්ෂ කිහිපය තුළදී ද පාසල්වලට ඇතුළත් වන නවක සිසුන් සංඛ්‍යාව තවදුරටත් අඩු විය හැකි බවත් පෙන්වා දුන් කාරක සභාව ඒ අනුව සියලුම පාසල් සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු බව ද සඳහන් කළේය.<br><br>පාසල්වල පළමු වසරට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ පුරෝකථනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව පෙන්වා දුන් අතර ඉදිරි සති 02 ක් තුළ පසුගිය වසර 20ක සංඛ්‍යා දත්ත අධ්‍යයනය කර මේ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය. මේ සඳහා පෙර පාසල්වලින් ද අවශ්‍ය තොරතුරු ලබාගැනීමට කටයුතු කිරීම සුදුසු බව කාරක සභාවේ අදහස විය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 06 | **පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වලින් තොරතුරු ලබා ගැනීමේ ගැටළු පැවතීම.** | • රජයේ අනුමත පෞද්ගලික පාසල් පමණක් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා නියාමනය වන බවත්; <br> • සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති ජාත්‍යන්තර පාසල්වල තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රමවේදයක් නොමැති බවත්; <br> • රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ බොහෝ පෞද්ගලික පාසල් ලියාපදිංචි වන්නේ සමාගම් ලෙස බැවින් ඔවුන්ගේ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ප්‍රකාශ කිරීමක් සිදු නොකරන බවත්; <br> • සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී එම තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුව ඇති බවත්; සහ <br> • පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් සෘජුව නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ වෙත අදාළ නීතිමය පසුබිම සකස් කර දීම අවශ්‍ය බවත්, <br><br> ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළාය. <br><br> **නිරීක්ෂණ/ නිර්දේශ** <br><br> • රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය පිළිබඳ ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන වාර්තාවෙන් ලබා දුන් නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව, <br> • පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් නිසි ප්‍රතිපත්තියක් නොමැති බව, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | • ජාත්‍යන්තර පාසල් පිළිබඳව පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවක් විසින් ලබා දුන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක වී නොමැති බව,<br><br>කාරක සභාව නිරීක්ෂණය කළ අතර, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන මගින් මේ සඳහා විසඳුමක් සකස් කර තිබේද යන්න කාරක සභාව විමසීය.<br><br>• එම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතින බවත්,<br>• එහි නිර්දේශ 41න් 32 කට පාර්ලිමේන්තුව එකඟ වී ඇති බව හා ඒ පිළිබඳව නැවත සමාලෝචනය කර වාර්තාවක් ඉදිරිපත් කරන බවත්<br>• රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය පිළිබඳ විගණන වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කරන ලද බවත්,<br>• එම වාර්තාව අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය කිරීම දුර්වල මට්ටමක පැවතීම සම්බන්ධයෙන් 2022 වර්ෂයේ අගෝස්තු මස සිට අධීක්ෂණ කටයුතු ආරම්භ කළ බවත්, පසුගිය වර්ෂයේදී පාසල් 24 ක් අධීක්ෂණය කරන ලද බවත්,<br>• සමාගම් පනත හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති අනෙකුත් ජාත්‍යන්තර පාසල් 400 කට ආසන්න සංඛ්‍යාවක් අධීක්ෂණය සඳහා නියාමන රාමුවක් හා උපායමාර්ග සකස් කරන ලෙසට 2018 වර්ෂයේදී ජාතික |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අධ්‍යාපන කොමිෂන් සභාවට පවරා ඇති බවත්,<br>• මෙම වර්ෂයේ අප්‍රේල් මාසය වන විට ඒ සඳහා නිර්ණායක සකස් කර ලබා දෙන බවට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දන්වන ලද බවත්,<br>• පාසල් පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදුකළ අධ්‍යයනය අනුව සකස් කළ වාර්තාවක් පසුගිය සතියේ ලබා දුන් බවත්,<br>• රජයේ අනුමත පෞද්ගලික පාසල් විසින් චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ආදායම් හා වියදම් වාර්තා ඉදිරිපත් කිරීම සිදු නොකරන බැවින් ඒ සම්බන්ධයෙන් ද මෑතකදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලිපියක් යොමු කරන ලද බවත්,<br>• මෙම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් විදේශගත වීම් හා විදේශීය ගුරුවරුන් සඳහා වීසා ලබාගැනීම් වැනි කාර්යයන් සම්බන්ධයෙන් ද ගැටළු පවතින බැවින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්ණායක ඉදිරිපත් කළ පසුව මෙම පාසල් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනම අංශයක් ස්ථාපිත කිරීම සුදුසු බවත්,<br><br>ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය.<br><br>ජාත්‍යන්තර පාසල් නිර්වචනය කිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු වූ අතර ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිපියක් අනුව, ජාත්‍යන්තර පාසල් යන නාමය භාවිත කළ හැක්කේ "විදේශීය සිසුන් අධ්‍යාපනය ලබන පාසල්" සඳහා පමණක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | බවත්, එනමුත් ඇතැම් පෞද්ගලික පාසල් ද ජාත්‍යන්තර පාසල් යන නාමය භාවිත කරන අවස්ථා ඇති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය. <br><br> අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් අදාළ තොරතුරු, චක්‍රලේඛ, රෙගුලාසි යනාදිය පිළිබඳව යාවත්කාලීනව සිටිය යුතු වන බව ප්‍රකාශ කළ කාරක සභාව ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසට ප්‍ර.ග.නි./ ග.නි වෙත උපදෙස් දුන්නේය. |
| 07 | **පාසල්වල එක් එක් ශ්‍රේණිවල පවතින පුරප්පාඩු ප්‍රමාණය ප්‍රසිද්ධ කිරීමේ කාර්යය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.** | **නිරීක්ෂණ/ නිර්දේශ** <br><br> පාසල්වල එක් එක් ශ්‍රේණිවල පවතින පුරප්පාඩු ප්‍රමාණය ප්‍රසිද්ධ කළ යුතු වුවද එම කාර්යය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය. ජාතික පාසල් 396 ම අදාළ තොරතුරු නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය. <br> පුරප්පාඩු පිළිබඳව, පාසල් මගින් ව්‍යුහ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත ලබාදෙන තොරතුරු නිරවද්‍ය නොවන අවස්ථා පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව, පාසල්වලින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙන තොරතුරුවල නිරවද්‍යභාවය තහවුරු කරගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව යෝජනා කළේය. |
| 08 | **2022 ජුනි 6 දිනැති අංක ED/1/6/1/10/2022 දරන ජාතික පාසල් අධ්‍යක්ෂගේ ලිපිය අනුව සිසුන් පදිංචියට ආසන්න පාසල් වෙත තාවකාලිකව ඇතුළත්** | සම්මත ක්‍රමවේදයෙන් බැහැරව පළමු, පස්වන හා හයවන ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කළ නොහැකි නමුත් රජයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලදී සේවා අවශ්‍යතාවය සලකා ස්ථාන දෙක අතර දුර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **<u>කිරීමේ කටයුතු තවදුරටත් සිදුකරමින් පැවතීම.</u>**<br><br>ඉහත ලිපිය අනුව රට තුළ පැවති අසීරු වාතාවරණය මත ආර්ථික හා ප්‍රවාහන අපහසුතා හේතුවෙන් සිසුන් පදිංචියට ආසන්න පාසල් වෙත තාවකාලිකව ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා තිබුණු අතර වර්තමානයේ එම අසීරුතා මඟහැරී තිබියදී ද එම ලිපිය අනුව ආසන්නම පාසලට තාවකාලිකව සිසුන් ඇතුළත් කිරීම හා පසුව ස්ථිර කිරීම සිදුකරන අවස්ථා ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. | අනුව ළමුන්ගේ තාවකාලික අනුයුක්ත කිරීම් සිදු කළ අවස්ථා පවතින බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>විෂයභාර ගරු අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර මෙම ලිපිය සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය. |
| 09 | **<u>ගුරුවරුන්ගේ දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේදී එම ගුරුවරුන්ගේ පදිංචියට සාපේක්ෂව දුෂ්කර පාසල්වල සේවය කළ කාලසීමාවන් සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.</u>**<br><br>තම පදිංචියට සාපේක්ෂව දුෂ්කර ප්‍රදේශවල සේවය කළ ගුරුවරුන් සඳහා සහනයක් ලැබෙන ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය. | • දුෂ්කර පාසල් නිර්වචනය සම්බන්ධයෙන් 2024/01 චක්‍රලේඛය මේ වන විට සකස් කර ඇති බවත්;<br>• අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සඳහා ජාතික මට්ටමින් අදාළ නිර්ණායකවලින් 80% ක් ඇතුළත් කර ඇති අතර පළාත් මට්ටමින් නිර්ණායක 20% ක් ලබාගැනීම සඳහා දැනුවත් කිරීම් සිදුකර ඇති බවත්;<br>• ඌව, දකුණ, උතුරුමැද, වයඹ හා උතුරු යන පළාත්වලින් මේ වන විට නිසි පරිදි නිර්ණායක සකස් කර ලබා දී ඇති බවත්, සබරගමුව පළාතේ නිර්ණායක අනුමත වී ඇති බවත්, ඒ අනුව එම පළාත්වල අනුමත පාසල් ලේඛන සකස් කරන ලෙසට නියම කරන ලද බවත්; සහ<br>• 2025 වර්ෂයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ නව චක්‍රලේඛය කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර එහිදී අධ්‍යයන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කාර්ය මණ්ඩල ගණය යටතේ පදිංචිය හා මුල් පත්වීම් ස්ථානය අතර දුර ප්‍රමාණය සලකා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට සාකච්ඡා කෙරෙන බවත්<br><br>ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මේ සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට කමිටුවක් පත්කර තීරණ ගැනීම සුදුසු බවට කාරක සභාව නිර්දේශ කළ අතර ගුරුවරුන්ගේ දුක්ගැනවිලි පිළිබඳව සාධාරණව කටයුතු කිරීම සඳහා වෙනම අංශයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ද පෙන්වා දුන්නේය. |
| 10 | <u>ගුරු උපදේශක සේවාවන් සම්බන්ධව පවතින ගැටළු</u> | සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ලබාදෙන ක්‍රමවේදය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව කාරක සභාව මෙහිදී ප්‍රකාශ කළේය.<br><br>• ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සීමිත තරග විභාගයෙන් සමත් වූ 442 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ මැයි මාසය තුළදී පවත්වා ජුනි මාසය තුළදී අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂිත බවත්;<br>• අධ්‍යාපන පරිපාලන සේවයේ කුසලතා පදනම යටතේ සමත් වූ 241 දෙනෙකු අතරින් 67 දෙනෙකු තෝරාගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් සේවා කාලයට අදාළ ලකුණු ඇතුළත් කර විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත්; |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | • සේවා ව්‍යවස්ථාවේ සඳහන් මාර්ගෝපදේශ යටතේ මෙම සම්මුඛ පරීක්ෂණවල ලකුණු ලබාදීම සිදු කරන බවත්; සහ<br>• සම්මුඛ පරීක්ෂණවලදී ඇති විය හැකි ගැටළු ඉදිරිපත් කිරීම සඳහා අභියාචන නිලධාරී ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරනු ඇති බවත්,<br><br>ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>මෙම සේවාවන්හි උසස්වීම් ක්‍රමවේදය සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳව කාරක සභාව විමසූ අතර, කාර්යක්ෂමතා කඩඉම් නියමිත පරිදි සමත් නොවීම, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවශ්‍ය සාමාර්ථ නොමැති වීම වැනි ගැටළු මත උසස්වීම් ලබා දිය නොහැකි වන අවස්ථා ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |
| 11 | **<u>පාසල්වල භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>පාසල් ගොඩනැගිලිවල නඩත්තු කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බවටත්, ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතු සඳහා අවශ්‍ය උපකරණ පාසල් වෙත ලබාගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙසටත් මෙහිදී කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් ලබාදුන්නේය.<br>පාසල්වලට ක්‍රීඩා හා සෞන්දර්ය ගුරුවරුන් පත්කිරීම පිළිබඳව කාරක සභාව විමසූ අතර, පාසලක ප්‍රාථමික අංශයේ සිසුන් සංඛ්‍යාව 100 ට වැඩි නම් එම අංශය වෙත සෞන්දර්ය විෂයය සඳහා ගුරුවරයෙකු අනුමත කරනු ලබන බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | | ක්‍රීඩා හා සෞන්දර්ය ගුරුවරුන් පත්කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කළ කාරක සභාව ක්‍රීඩා විෂයය සඳහා ගුරු සහායකයින්ගෙන් ලැබෙන දායකත්වය අගය කළ අතර, සෞන්දර්ය විෂයයන් සඳහා ද ගුරු සහායකයින් හෝ බඳවා ගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දුන්නේය.<br><br>පාසලක සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව විෂයයන් අනුව තීරණය කරනු ලබන ආකාරය පිළිබඳ වාර්තාවක් 2024.05.17 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 06/2021 හි දක්වා ඇති නිර්ණායක අනුව එක් එක් විෂයය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව තීරණය කරනු ලබන බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/05/90/Audit/COPA/2024 හා 2024.05.20 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |

**සංචාරක අමාත්‍යාංශය**

***(2020, 2021 සහ 2022 මුදල් වර්ෂ පදනම් කරගනිමින් සංචාරක අමාත්‍යාංශය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ සංචාරක අමාත්‍යාංශයේ වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීම)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 මැයි 07**

**කැඳවන ලද ආයතන -**
- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| ❖ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>සංචාරක ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ නොකිරීම හා සංචාරක උපාය මාර්ගික සැලසුම් සකස් නොකිරීම</u>.** | ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රතිපත්තිය 2024 පෙබරවාරි මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත වී තිබුණ ද මෙතෙක් එය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු නොකිරීම හා ඒ හේතුවෙන් සංචාරක උපාය මාර්ගික සැලසුම් සකස් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසා සිටින ලදී.<br><br>අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලද සංචාරක ප්‍රතිපත්තියේ දෙමළ පරිවර්තනයේ සෝදුපත් බැලීම මේ වනවිට සිදු කරනු ලබන බවත්, එය අවසන් වූ පසු සංචාරක ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කිරීම තවත් සතියක පමණ කාලයක් තුළ සිදුකළ හැකි බවටත් සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි)/ ගණන්දීමේ නිලධාරි (ග.නි.) විශ්වාසය පළ කළේය.<br><br>එමෙන්ම සංචාරක උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු ද ආරම්භ කර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි, එම සැලැස්ම සකස් කිරීමේදී ආසියානු සංවර්ධන බැංකුව සමග සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය බව ද සඳහන් කළේය. එම සැලැස්මට අදාළ කටයුතු ද මෙම මාසය අවසන් වනවිට සකස් කර අවසන් කළ හැකි වනු ඇති බව ද ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කර සිටියේය. |
| 02 | **<u>සංචාරක සංවර්ධන ප්‍රදේශවලට අදාළ නියමයන් සකස් කිරීම හා සංචාරක ආකර්ෂණීය ස්ථානයන් හඳුනා ගැනීම</u>.** | මේ පිළිබඳව අදහස් දක්වමින් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කර සිටියේ අදාළ නියෝග සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතු විශේෂඥ දැනුම ප්‍රමාණවත් නොවන බැවින් ආසියානු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (3) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් තුළ කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි වුවත්, 2022 වර්ෂය දක්වා ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රධාන සංචාරක සංවර්ධන කලාප 14 සහ 2023 වර්ෂයේ සංචාරක සංවර්ධන කලාප ලෙස ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 සඳහා නියෝග සෑදීමට හා ආකර්ශණීය ස්ථාන හඳුනා ගැනීමට කටයුතු කර නොමැති බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br><br>1987 හා 1988 වර්ෂවල සංචාරක කලාප ලෙස ගැසට් පත්‍රයේ පළ කරන ලද හික්කඩුව හා උණවටුන වැනි ප්‍රදේශ සම්බන්ධයෙන් කිසිඳු රෙගුලාසියක් මෙතෙක් සකස් කර නොතිබීම පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළ විය. | සංවර්ධන බැංකුවේ නියෝජිතයින් හා සංචාරක ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් බහුල මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරුන්ගේ සහයෝගය ලබා ගෙන නියෝග සකස් කිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට අපේක්ෂා කරන බවයි.<br><br>1968 පැරණි පනත අනුව සංචාරක කලාප සඳහා රෙගුලාසි සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි., ආසියානු සංවර්ධන බැංකුව සමග නියමු ව්‍යාපෘතියක් ලෙස මුලින්ම සංචාරක කලාප 5ක් සම්බන්ධයෙන් නියෝග සකස් කිරීමටත්, ඉන් අනතුරුව, ඉතිරි කලාප සඳහා දේශීය යාන්ත්‍රණයක් මගින් අවශ්‍ය නියෝග සකස් කිරීමටත් හැකි බව ආසියානු සංවර්ධන බැංකුව විසින් උපදෙස් ලබා දී ඇති බව ද මෙහිදී පෙන්වා දෙන ලදී.<br><br><u>නිර්දේශ</u><br><br>2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (3) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් නියෝග සකස් කිරීම සඳහා පැරණි පනත යටතේ ගැසට් කර ඇති සංචාරක ප්‍රදේශ නැවත ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට හා නියෝග සකස් කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු සංචාරක කලාප හඳුනා ගැනීමට කටයුතු කර, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මාස 3ක් තුළ (2024.08.06 දිනට පෙර) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA හා 05.06.2024 දිනැති ලිපිය මගින් මූලික වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 03 | <u>**සංචාරක සංවර්ධන සැලසුම් සකස් කිරීම ප්‍රමාද වීම**</u> | හඳුනා ගත් සංචාරක සංවර්ධන කලාප 7ක් සඳහා ප්‍රධාන සංචාරක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරිය අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණ ද, මේ වනවිට අදාළ සැලසුම් සකස් කර ඇත්තේ කලාප 02 ක් (ඇල්ල සහ ආරුගම්බොක්ක) සම්බන්ධයෙන් පමණක් බව කාරක සභාව විසින් අනාවරණය කරන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සමග එක්ව කටයුතු කරමින් සිටින බව සඳහන් කළ ප්‍ර.ග.නි./ ග.නි., මෙම වසරේ අගෝස්තු මාසය වනවිට කල්පිටිය හා හික්කඩුව යන කලාප 2 සඳහා ද සංචාරක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කිරීමට නියමිත බව සඳහන් කළේය. |
| 04 | 2024 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය මගින් සංචාරක අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රතිපාදන සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසන ලදී. | එහිදී අදහස් දැක්වූ ප්‍ර.ග.නි./ ග.නි., මෙවර අයවැය මගින් සංචාරක අමාත්‍යාංශයට සෘජු ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 610 ක මුදලක් සහ කිතුල්ගල හා පින්නවල සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා රු.මිලියන 750 ක මුදලක් වෙන් කර ඇති බව සඳහන් කළේය. ඒ අනුව, මිලියන 610 ක මුදල වියදම් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ සැලසුම් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කමිටුව සාකච්ඡා කර තීරණය කරන බවත්, කිතුල්ගල හා පින්නවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරන ලෙස සබරගමුව පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දැනුම් දී ඇති බවත් ඔහු ප්‍රකාශ කළේය.<br><br>අයවැය ප්‍රතිපාදන වලට අමතරව බදු ආදායම් හා වෙනත් ආදායම් මගින් වාර්ෂිකව සංචාරක සංවර්ධන අරමුදලට බැර වන මුදල ආසන්න වශයෙන් රු. බිලියන 5.7 ක් (රු. මිලියන 5700) පමණ වන බවත්, එම මුදල 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24 (8) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යන ආයතන හතර අතරේ බෙදී යන බවත් මෙහිදී අනාවරණය විය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>2024 අයවැය මගින් සංචාරක අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති වැඩපිළිවෙළ සම්බන්ධයෙන් වාර්තාවක් සති 2ක් තුළ (2024.05.22 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA හා 28.05.2024** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 05 | **<u>ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලබන සංචාරකයින්ගෙන් 33% ක් පමණ එක් වරකට වැඩි වාර ගණනක් (Repeat Customers) මෙරට සංචාරය කළ පුද්ගලයින් වීම.</u>** | ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලබන සංචාරකයින්ගෙන් 33% ක් පමණ එක් වරකට වැඩි වාර ගණනක් (Repeat Customers) මෙරට සංචාරය කළ පුද්ගලයින් බව කාරක සභාව හමුවේ ප්‍රකාශ වුවත්, ඒ පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යනු නොලබන බව මෙහිදී අනාවරණය විය.<br><br>සංචාරකයින් පිළිබඳ බොහෝ තොරතුරු තම වෙබ් අඩවිය තුළින් ලබා ගත හැකි වුවත්, අදාළ පුද්ගලයා මෙරට සංචාරය කරනු ලබන්නේ කීවෙනි වතාවටද යන්න එහි වාර්තා නොවන බවත්, එම තොරතුරු ඉදිරියේදී ඇතුළත් කළ හැකි බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කර සිටියේය.<br><br><u>නිර්දේශ</u><br><br>නැවත නැවත ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලබන සංචාරකයින් (Repeat Customers) ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්ත ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA හා 05.06.2024 දිනැති ලිපිය මගින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**<br><br>**සංඛ්‍යා ලේඛන වලට අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් සැලකිය** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **යුතු ප්‍රතිශතයක් යළි මෙරටට පැමිණෙන බව පෙනී යන බව සඳහන් කර ඇත.** <br><br> **සමීක්ෂණ වලට අනුව එම ප්‍රමාණය 2015 වර්ෂයේ 15% ක්ද, 2018 වර්ෂයේ 17.2% ක්ද වශයෙන් සඳහන් වේ.** |
| 06 | **<u>2010 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත පවරා දෙන ලද කල්පිටිය දූපත් 6 ක ඉඩම් අක්කර 457.44 ක් ආයෝජන කටයුතු සඳහා යොදා ගැනීමට වසර 10 ක පමණ කාලයක් ගතවීම හා තවත් දූපත් 2 කට අයත් ඉඩම් අක්කර 1388.04 ක් පවරා දී වසර 13 ක කාලයක් ගතවී ඇතත් එම ඉඩම් ආයෝජන කටයුතු සඳහා යොමු නොකිරීම.</u>** | විවිධ හේතූන් මත දූපත් කීපයක ආයෝජන කටයුතු මෙතෙක් ආරම්භ කර නැති බව සඳහන් කළ ප්‍ර.ග.නි./ ග.නි., කලපුව තුළ පිහිටි දූපත් සම්බන්ධයෙන් ගැටළුවක් නැතත්, මුහුදේ පිහිටා ඇති දූපත් සම්බන්ධයෙන් ආයෝජකයින් හට විශාල ගැටළුවක් ඇති බව සඳහන් කළේය. මුහුදේ පිහිටා ඇති එක් දූපතක් මේ වනවිට ජලයෙන් යටවී ඇති අතර, සමුද්‍ර ඛාදනය අධික වීම නිසා බත්තලංගුණ්ඩුව වැනි දූපත්වල හැඩය වෙනස් වී ඇති බව ද සඳහන් කළේය. එම නිසා එම දූපත්වල ආයෝජන කටයුතු කිරීමට ආයෝජකයින් සොයා ගැනීම ගැටළු සහගත බවත්, කලපුව තුළ පිහිටි දූපත් 6 ක ආයෝජකයින් ව්‍යාපාර කටයුතු ඇරඹීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් සිටින බවත් ප්‍ර.ග.නි./ ග.නි. වැඩි දුරටත් සඳහන් කළේය. <br><br> **<u>නිර්දේශ</u>** <br><br> ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සතු දූපත්වල ආයෝජන කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් බලපා ඇති ගැටළු හා ඒවා නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත (2024.06.06 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA හා 05.06.2024 දිනැති ලිපිය මගින් මේ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**<br><br>**සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දී ඇති කල්පිටිය දූපත් 12 ක් අතුරින් 10 ක් ආයෝජකයින් වෙත බදු පදනම මත ලබා දී ඇති බවත්, විශාලතම දූපත් 2 වන උච්චමුනෙයි හා බත්තලංගුණ්ඩුව යන දූපත් සඳහා මෙතෙක් ආයෝජකයින් ඉදිරිපත් වී නැති බවත් වාර්තාව මගින් පෙන්වා දී ඇත.** |
| 07 | <u>නානුඔය දුම්රිය ස්ථානය දුම්රිය උරුමයක් ලෙස නවීකරණය කිරීමේ කටයුතු</u> | සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය රු.74,630,924.00 ක වටිනාකමකට පුරාවිද්‍යාත්මක අනන්‍යතාවය රැකෙන පරිදි නානුඔය දුම්රිය ස්ථානය දුම්රිය උරුමයක් ලෙස නවීකරණය කිරීමේ කටයුතු 2021 වර්ෂයේ ආරම්භ කර ඇති අතර, වැඩ නිම කිරීමට නියමිත දිනය ඉක්මවා ගියද, ව්‍යාපෘතියේ වැඩ මෙතෙක් අවසන් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසා සිටින ලදී.<br><br>සංචාරක අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ නමුත්, අදාළ කොන්ත්‍රාත්කාර සමාගමට හිඟ මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිසා මෙහි වැඩ කටයුතු ප්‍රමාද වූ බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගය ඇතිව |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>- ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td></td><td></td><td>මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට අමාත්‍ය මණ්ඩලය උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව මෙම වසරේ ඔක්තෝබර් මාසය වනවිට ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට හැකි වනු ඇති බවත් ප්‍ර.ග.නි./ග.නි. වැඩිදුරටත් සඳහන් කළේය.</td></tr>
<tr><td colspan="3">බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ මහාභාරකාර දෙපාර්තමේන්තුව<br>(විගණකාධිපතිවරයා විසින් 2021 අප්‍රේල් මස 30 දින නිකුත් කරන ලද මහා භාරකාරතැන වෙත පවරා ඇති බුදල් දේපළ කළමනාකරණය පිළිබඳ වූ කාර්යසාධන විගණන වාර්තාව පරීක්ෂා කිරීම)<br>විමර්ශනය කරන ලද දිනය - 2024 මැයි 08</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>❖ මහාභාරකාර දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>01</td><td><u>පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීම වෙනුවෙන් රු.මිලියන 35ක ප්‍රතිපාදන 2024 අයවැයෙන් ලබා දී ඇති බැවින් එහි වර්තමාන තත්ත්වය</u><br><br>පරිගණක දත්ත පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් මහා භාරකාර දෙපාර්තමේන්තුව සතු වත්කම් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමේ දී ගැටළුකාරී තත්ත්වයක් පවතින බව කාරක සභාව පෙන්වා දුන්නේය.</td><td>අදාළ ප්‍රතිපාදනය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 5ක දත්ත පද්ධතීන් සකස් කිරීම සඳහා ලද ප්‍රතිපාදනයක් බවත්, දැනට එම කටයුත්ත සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඇති බවත්, අදාළ ආයතනයන්හි අවශ්‍යතාවයන් හඳුනා ගැනීමෙන් පසු ඉදිරි සති කිහිපය තුළ මිල ගණන් කැඳවීම් සිදුකරනු ලබන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) ප්‍රකාශ කළේය.<br><br>එමෙන්ම දැනට දෙපාර්තමේන්තුවට අයත් දේපළ ඇතුළත් ලේඛනයක් සකස් කර ඇති බවත්, නිලධාරීන් දෙදෙනෙකු යොදවා දිවයින පුරා විසිරී පවතින</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුව සතු දේපළ පරිගණකගත කිරීම සිදු කරනු ලබන බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. |
| 02 | **<u>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ දිවයින පුරා විසිරී ඇති දේපළ පරිපාලනය කිරීම</u>**<br><br>දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට දේපළ අධීක්ෂණය සම්බන්ධයෙන් බලය පැවරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට ඇති හැකියාව පිළිබඳව කාරක සභාවේ දී සාකච්ඡාවට ලක්විය. | මහා භාරකාර ආඥා පනතේ ප්‍රතිපාදන අනුව දේපළ සම්බන්ධයෙන් බලය පැවරීම සිදු කළ හැක්කේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය මහා භාරකාරවරුන් වෙත බවත් ඔවුන් වසර 10ක අවම සේවා පළපුරුද්දක් සහිත නීතිඥයන් විය යුතු අතර දේපළ කළමනාකරණය සම්බන්ධ අවිනිශ්චිත තත්ත්වයකදී දිසා අධිකරණ අවසරයක් මත ඒ සම්බන්ධයෙන් බලය පැවරීමට ප්‍රතිපාදන පවතින බවත් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දුන්නේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>නව බඳවාගැනීම් සිදු කිරීමට කාලයක් ගතවන බැවින් ගරු අමාත්‍යතුමා සමඟ ද සාකච්ඡා කොට නීතිපති උපදෙස් ද ලබාගෙන ආඥා පනත සංශෝධනය කර හෝ දිසා අධිකරණ වලින් අදාළ අවසරය ලබාගෙන මහා භාරකාරතැන වෙත පවරා ඇති මුදල්/ දේපළ පරිපාලනය ප්‍රාදේශීය වශයෙන් සිදු කිරීම සඳහා දිස්ත්‍රික්ක 25හි ම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කර ගනිමින් සුදුසු යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කරන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා (ප්‍ර.ග.නි.) / ගණන් දීමේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | නිලධාරියා (ග.නි.) වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 03 | **දෙපාර්තමේන්තුව වෙත දේපළ ලැබීම** | අන්තිම කැමති පත්‍ර හා අධිකරණ නියෝග මඟින් දෙපාර්තමේන්තුව වෙත දේපළ ලැබීම සිදුවන බව ප්‍රකාශ කළ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රොබේට් බලපත්‍ර, අද්මිනිස්ත්‍රාත් බලපත්‍ර හා ආරක්ෂිත භාරකරුවෙක් ලෙස පත් කරමින් අධිකරණය මඟින් මහාභාරකාර දෙපාර්තමේන්තුව වෙත දේපළ ලබාදීම සිදුවන බව සඳහන් කළේය. මේ සඳහා ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් වැනි පාර්ශ්වයන් සම්බන්ධීකරණයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කරන බව හෙතෙම වැඩිදුරටත් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. |
| 04 | **මහා භාරකාරතැන වෙත පවරා ඇති දේපළ / වත්කම් වර්ග හා එම වර්ග යටතේ ලංකාව පුරා තිබෙන දේපළවල නිශ්චිත ප්‍රමාණ** | නිසි තොරතුරු පද්ධතියක් නොමැති වීම හේතුවෙන් දේපළ හා වත්කම් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත ඉදිරිපත් කිරීමේ අපහසුතාවයක් පවතින බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. <br><br> **නිරීක්ෂණ/ නිර්දේශ** <br><br> මහා භාරකාරතැන වෙත වත්කම් ලැබෙන විවිධ මාර්ග කවරේ ද යන්න සහ එම එක් එක් වත්කම ලැබුණේ කවදාද, පවරනු ලැබුවේ කවුරුන් විසින්ද, පැවරීමට අදාළ කොන්දේසි කවරේද ආදී කරුණු ඇතුළත් ලේඛනයක් සකස් කරන ලෙසත්, ඉහත තොරතුරු ද ඇතුළත්ව මහා භාරකාර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>- **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන එක් එක් සේවාවන් හා එම සේවාවන් යටතේ පසුගිය වසර 5 තුළ සිදුකර තිබෙන කාර්යභාරය පිළිබඳව 2024 ජුනි මස 20 දින කැඳවීමට නියමිත මීළඟ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer Presentation) සිදු කරන ලෙසත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| 05 | <u>**මහා භාරකාරතැන වෙත පවරා ඇති ඉඩම්/ දේපළ බදුදීම්**</u> | දෙපාර්තමේන්තුව මඟින් වතු 11ක් පාලනය කිරීම සිදුකරනු ලබන අතර ඉන් ලැබෙන ආදායමින් අදාළ භාරයන්හි සඳහන් අරමුණු ඉෂ්ට කිරීම සිදුකරන බවත් ඒ අතර පාඩු ලබන දේපළ ද පවතින බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. එම පාඩු ලබන වතු සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා සහ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර ටෙන්ඩර් කැඳවා බදු දීමට තීරණය කර ඇති බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br><u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br><br>බදු දීමට අමතරව යුධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආදී ආයතන සමඟ සාකච්ඡා කර සෙබළුන් හා සිරකරුවන් යොදවා මෙම ඉඩම් වඩාත් ඵලදායි වගා කටයුතු හා වෙනත් කර්තව්‍යයන් සඳහා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | යෙදවීම වැනි විකල්ප ක්‍රම පිළිබඳව ද කාරක සභාව පෙන්වා දෙන ලදී. |
| 06 | <u>භාරයන්ගේ මුදල්</u> | මහා භාරකාර දෙපාර්තමේන්තුව සතුව භාර 1130ක් පවතින අතර ඒ අතරින් භාර 1100ක් සක්‍රීය තත්ත්වයේ පවතින බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. මෙම භාරයන්ගේ මුදල්, ප්‍රධාන බැංකු 3ක ගිණුම් 1936ක තැන්පත් කර ඇති අතර ඒවායේ රු.මිලියන 2,823ක මුදලක් පවතින බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කළේය.<br><br>මෙම මුදල් අඩු පොලී අනුපාත යටතේ තැන්පත් කර ඇති බව විගණනයේදී පෙන්වා දී ඇති අතර අනතුරුව රාජ්‍ය බැංකු සමඟ සාකච්ඡා කර වාසිදායක පොලී අනුපාතික යටතේ තැන්පත් කිරීම මඟින් 2023 වර්ෂය සඳහා රු.මිලියන 252ක ආදායමක් උත්පාදනය කර ඇති බවත් එම මුදල් අදාළ භාරයන්හි අරමුණු ඉෂ්ට කිරීම සඳහා යොදවන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළ අතර ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ලෙස ද අදාළ මුදල් ආයෝජනය කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය. |
| 07 | <u>භාර වලින් ලද වාහන</u> | එක් භාරයකින් ලද වාහනයක් දෙපාර්තමේන්තුව සතුව පවතින බවත් එය එම භාරයේ අපේක්ෂාව අනුව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා යොදාගෙන ඇති බවත් බුද්ධශාසන, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය. |
| 08 | <u>ගාල්ල බද්දේගම සුදුවැලිපොත පිහිටි හැරී හපුගොඩ බූදලයේ වර්තමාන තත්ත්වය</u> | අක්කර 113ක භූමි ප්‍රමාණයකින් යුතු එම දේපළ දිගින් දිගටම පාඩු ලබන දේපළක් බවත් එහෙයින් බදු දීම සඳහා මිල ගණන් කැඳවූ නමුත් ලද වැඩිම ලංසු අගය ද අපේක්ෂිත රජයේ තක්සේරුවට වඩා අඩු අගයක් බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>බදු දීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදුකරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දුනි. |
| 09 | <u>භාරයන්ගේ අර්ථලාභීන්</u> | භාරයන්ගේ පැවරුම්කරුවන්ගේ අන්තිම කැමැත්ත පරිදි කටයුතු ඉෂ්ට කොට ඉතිරියක් තිබේනම් මහා භාරකාරවරයාගේ අනුමැතිය පරිදි පුණ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අවසර ලබාදී ඇති බවත්, භාර රාශියක අඛණ්ඩ අර්ථලාභීන් ලෙස පුණ්‍ය ආයතන රාශියක් පවතින බවට කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කෙරිණි. එම භාරයන්ගෙන් මුදල් ලැබීම පිළිබඳව අදාළ පුණ්‍ය ආයතන දැනුවත් කළ බවත්, මෙම දේපළ පැවරුම්කරුවන්ට පුණ්‍යානුමෝදනා කිරීමේ පුණ්‍යකර්ම ද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 10 | <u>විදේශ වන්දි උරුමකරුවන් වෙත ලබාදීම</u><br><br>විදේශයන්හිදී ශ්‍රී ලාංකිකයෙක් මියගිය විටදී උරුමකරුවන්ට ලබාදීම සඳහා ලැබෙන වන්දි මුදල් මහාභාරකාර දෙපාර්තමේන්තුවට ලැබෙන බව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළ අතර දැනට විදේශ වන්දි ගිණුමේ රු.මිලියන 160ක පමණ මුදලක් පවතින බව කාරක සභාවේ දී ප්‍රකාශ විය. | මෙහිදී නොගෙවා පවතින මුදල් ප්‍රමාණයන් පිළිබඳව කාරක සභාව විමසා සිටි අතර විදේශ වන්දි උරුමකරුවන් සොයා ගැනීමට උපරිම උත්සාහ කළ ද සැබෑ උරුමකරුවන් හඳුනාගැනීමේ ගැටළු පැන නැගුණු අවස්ථාවල එසේ මුදල් නොගෙවා රඳවාගෙන ඇති බවත්, එම මුදල් යම් කාලයක් ඉක්මවීමෙන් අනතුරුව මහා භාණ්ඩාගාරයට බැර කිරීමට කටයුතු කරනු ලබන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ඒ අනුව රු.ලක්ෂ 21කට ආසන්න මුදලක් පසුගිය වසරේ දී මහා භාණ්ඩාගාරයට බැර කළ බව ද බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>එමෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය (Consular Affairs Division) මඟින් අදාළ මියගිය පුද්ගලයාගේ තොරතුරු මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන අතර උරුමකරුවන් වෙත එම මුදල් ලබාදීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>විදේශගත වූ ශ්‍රී ලාංකිකයෙක් මියගිය විටදී එම පුද්ගලයා වෙනුවෙන් වූ වන්දි මුදල් ලබාගැනීම සඳහා දැනට පවතින නීතිමය තත්ත්වය, එම ක්‍රියාවලියේ දී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය, සහ පසුගිය වසර 5 තුළ මහා භාරකාරතැන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | වෙත එලෙස ලබා දී ඇති වන්දි ප්‍රමාණයන් හා විදේශ වන්දි ගෙවීමට අදාළ චක්‍රලේඛ පිළිබඳ වාර්තාවක් 2024 ජුනි මස 06 වන දිනට ප්‍රථමයෙන් කාරක සභාව වෙත ලබාදෙන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දන්වා සිටින ලෙසත්, උක්ත විෂය සම්බන්ධයෙන් 2024 ජුනි 20 දින පැවත්වීමට නියමිත මීළඟ කාරක සභා රැස්වීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ මහජන රාජ්‍ය තාන්ත්‍රික අංශය (Consular Affairs Division) කැඳවීමට කටයුතු කරන ලෙසත් කාරක සභාවේ සභාපති විසින් කාරක සභාවේ ලේකම් වෙත උපදෙස් ලබාදෙන ලදී. <br><br> විදේශගත වූ ශ්‍රී ලාංකිකයෙක්/ ශ්‍රමිකයෙක් මියගිය විටදී උරුමක්කරුවන් සඳහා වන්දි මුදල් හා හිඟ වැටුප් ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සකස් කරන ලද සාරාංශයක් 2024.05.13 දින වනවිට කාරක සභාව වෙත ලැබීමට සලස්වන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 11 | <u>විහාර වන්දි ලබාදීම</u> | මෙම වන්දි මුදල් ප්‍රාදේශීය ලේකම් හරහා මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබීමෙන් පසු බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා විසින් කරනු ලබන ලිඛිත දැනුම් දීම් මත එම මුදල් නිදහස් කිරීම සිදුකරනු ලබන බවත්, එම මුදල් පරිහරණය කිරීමේ අයිතියක් තම දෙපාර්තමේන්තුවට නොමැති බවත් දෙපාර්තමේන්තුව භාරයේ පවතින අදාළ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබෙන අතර එම පොලී |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | මුදල් ද අදාළ විහාරස්ථානයටම ගෙවනු ලබන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>දිවයින පුරා පිහිටි විහාරස්ථාන 417 ක් සඳහා රු.මිලියන 1170ක වන්දි ප්‍රමාණයක් ගෙවීමට ඇති බැවින්, එලෙස වන්දි ලබාදීම සඳහා නියමිත විහාරස්ථාන වෙත යම් ආකෘති පත්‍රයක් සකස් කර යවා අවශ්‍ය තොරතුරු ලබාගෙන නඩු කටයුතු/ ප්‍රශ්නගත කරුණු නොමැති විහාරස්ථාන සඳහා අදාළ මුදල් නිදහස් කිරීමට කටයුතු කර ඒ සම්බන්ධ ප්‍රගතිය 2024 ජුනි 20 දින වනවිට කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලෙස කාරක සභාව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>එමෙන්ම විහාරස්ථාන 417 සඳහා විහාර වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට අදාළ හේතු හා ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය පිළිබඳව වර්ගීකරණය කළ කාලානුරූප ලේඛනයක් (අවු. 20ට වැඩි කවර විහාරස්ථාන ද වශයෙන්) කාරක සභාව වෙත යොමුකරන ලෙසත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 12 | <u>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි තොරතුරු යාවත්කාලීන කිරීම</u> | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මහා භාරකාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි, දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්, අවශ්‍ය අයදුම්පත් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | හා දේපළ සම්බන්ධ තොරතුරු ඇතුළත් කර එහි දෙමළ පරිවර්තනයන් ද 2024 ජුනි මස 1 දිනට ප්‍රථමයෙන් ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කරන ලදී. |
| 13 | <u>මහා භාරකාරවරයා සතු දේපළ රජයට පවරාගත් අවස්ථාවලදී වන්දි ලබාදීම</u> | වොක්ස්වැගන් කර්මාන්තශාලාවට හා වයඹ විශ්ව විද්‍යාලයට මහා භාරකාරවරයා සතු දේපළ පවරාගත් බවත් ඒ සඳහා ලද රුපියල් මිලියන ගණනක වන්දි මුදල නඩු කටයුත්තක් හේතුවෙන් මේ වනතෙක් නිදහස් කර ගැනීමට නොහැකි වී ඇති බවත් එම මුදල් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ඉඩම් පැවරුම්කරුවන්ගේ අරමුණු ඉෂ්ට කිරීම සඳහා යොදවන බවත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

***(මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඇතුළුව ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මූලිකත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, ජාතික ආර්ථික හා භෞතික සැළසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව සහ ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එක්ව 2024.01.24 දින කාරක සභාව විසින් ලබා දුන් නියෝගවල ප්‍රගතිය සමාලෝචනය කිරීම)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 මැයි 09**

කැඳවන ලද ආයතන

- ❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- ❖ ශ්‍රී ලංකා රේගුව
- ❖ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| ❖ | සුරාබදු දෙපාර්තමේන්තුව | |
| 01 | <u>රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කිරීම</u> | ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීමට අවශ්‍ය යෝජනාවලියක් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි)/ගණන් දීමේ නිලධාරී (ග.නි) වෙත නිර්දේශ කර තිබුණද ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආදායම වර්ධනය කර ගැනීමේ යෝජනාවන් පමණක් ඉදිරිපත් කර තිබූ අතර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ආදායම වර්ධනය කර ගැනීමේ යෝජනාවලියක් මෙන් ම ක්‍රියාකාරී සැලැස්මක් ද ඉදිරිපත් කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>අදාල ආයතන තුන විසින් ලබා දී ඇති යෝජනාවලි ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින බවත් හඳුනාගත් ක්‍රියාකාරී සැලසුම් වල ඇති යෝජනා, පාර්ශවයන් අතර එකඟතාවයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ ග.නි කාරක සභාවට දන්වා සිටියේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | <u>**සුරාබදු දෙපාර්තමේන්තුවේ සත්‍ය නිෂ්පාදනයට නිසි ආකාරයෙන් බදු අය කර ගැනීම**</u> | සුරාබදු ආදායම අභිමිවීමේ ප්‍රතිශතය මේ වන විට 1% ට වඩා අඩු ප්‍රමාණයක් බවත්, ආදායම 99% ක්ම ආරක්ෂා වී ඇති බවත් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලදි.<br><br><u>**නිරීක්ෂණ**</u><br><br>කෙසේ නමුත්, සත්‍ය මත්පැන් නිෂ්පාදනයේ වටිනාකම හෙළිදරව් නොවීම (under invoice) මත රජයට අයවිය යුතු බදු ආදායම නිසි ලෙස තක්සේරුකර ගැනීමට නොහැකි වී ඇති බවත්, පසුගිය වසරට වඩා 2024 වසර තුළ ආදායමේ වැඩිවීමක් දක්නට ලැබෙනුයේ රජය විසින් පැනවූ බදු මුදල් වැඩි කිරීම හේතුවෙන් බවත් කාරක සභාව පෙන්වා දුන්නේය. |
| 03 | <u>**නීත්‍යානුකූල නොවූ මත්පැන් භාවිතය**</u><br><br>මෙරට නීත්‍යානුකූල නොවූ මත්පැන් කොපමණ ප්‍රමාණයක් භාවිතා වන්නේද යන්න පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබේද යන්න සම්බන්ධයෙන් සහ එම නීත්‍යානුකූල නොවූ මත්පැන් පරිභෝජනය අවම කර ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති වැඩපිළිවෙළ පිළිබඳව කාරක සභාව විමසීය. | මේ සම්බන්ධව ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO), සුරාබදු දෙපාර්තමේන්තුව, සහ අනෙකුත් ආයතන විසින් පරීක්ෂණ සිදු කර ඇති බවත් මෙරට මත්පැන් පරිභෝජනයෙන් 30% - 35% අතර ප්‍රමාණයක් නීත්‍යානුකූල නොවූ මත්පැන් භාවිතා කරනු ලබන බවත් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා ප්‍රකාශ කළේය. එසේම මත්පැන්වල මිල ඉහළ යාම මේ සඳහා හේතු වී ඇති බවත් නීතිවිරෝධි මත්පැන් වැටලීම් සිදු කිරීම සහ නව සුරාබදු බලපත්‍ර ලබා දීම වැනි ක්‍රමවේදයන් තුළින් මෙම තත්ත්වය අවම කර ගැනීමට හැකි බවත් ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය. |
| 04 | <u>**තාවකාලික එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචිය පිළිබඳ වර්තමාන තත්ත්වය**</u> | • මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ජනරාල්ගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කළ බවත්;<br>• එම කමිටුව විසින් නිර්දේශ 08 ක් ලබා දී ඇති බව හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් ශ්‍රී ලංකා රේගුවට සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී ඇති බවත්;<br>• ඇතැම් නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇති බවත්; සහ<br>• ස්ථිර VAT බදු ලියාපදිංචිය ඇති පාර්ශවයන්ට තාවකාලික VAT අංක ලබා නොදෙන බවත්,<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>තාවකාලික වැට් බදු ලියාපදිංචියට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුවට දත්ත හුවමාරු කර ගත හැකි වන පරිදි සත්‍යාපනය කළ හැකි QR කේතයක් (verifiable QR Code) යොදා ගැනීමට පියවර ගැනීම සුදුසු බව කාරක සභාව යෝජනා කළේය.<br><br>තාවකාලික වැට් බදු ලියාපදිංචිය බොහෝ වංචාවන්ට හේතු වී ඇති බැවින් එම තත්ත්වය වළක්වාගැනීම සඳහා තාවකාලික වැට් බදු ලියාපදිංචිය අහෝසි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ කාරක සභාව ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතීන් ඇතුළු අනෙකුත් නෛතික අවශ්‍යතාවයන් ඉටුකර ගන්නා ලෙසත්, |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් 2024.05.27 වන දිනට පෙර ලිඛිත වාර්තාවක් කාරක සභාව වෙත ලබාදෙන ලෙසත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කරන ලදි.<br><br>**මේ සම්බන්ධව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/04/COPA Genera 2022 හා 2024.06.07 දිනැති ලිපියෙන් සහ අංක MF06/04/COPA Genera 2023 – Vol-iii හා 2024.07.19 සහ 2024.07.22 දිනැති ලිපි මගින් වාර්තා කර ඇත.**<br><br>මෙම කාරක සභාව නැවත ඉදිරි දිනෙක කැඳවන බැවින් එදිනට, තාවකාලික වැට් බදු ලියාපදිංචිය හේතුවෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වය වළක්වා ගැනීමට අවශ්‍ය මාර්ගගත (On line) වැඩපිළිවෙලක් සකසා (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා රේගුවට අදාළ වන ලෙස) එය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පරිගණක දෘෂ්‍ය ඉදිරිපත් කිරීමක් (Computer Presentation) සිදු කරන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත වැඩිදුරටත් නිර්දේශ කරන ලදි. |
| 05 | <u>රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරු කිරීම සහ රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම</u> | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය නොකිරීම නිසා ඇතිවන ගැටළු පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව, රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීමේ අවශ්‍යතාවය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අවධාරණය කළේය. එහි දී අදාළ දත්ත පද්ධති සකස් කර ගැනීම සඳහා සුදුසු පුද්ගලයන්/ආයතන දැන්වීම් පළ කිරීම හරහා තෝරා ගන්නා ලෙසත්, උපයන ආදායමෙන් ප්‍රතිශතයක් ඔවුන්ගේ සේවා ගාස්තු ලෙස ගෙවීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය. <br><br> මේ වන විට ඒ සඳහා යෝජනා (EOI - expression of interest) කැඳවීමට තීරණය කර ඇති බව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |
| 06 | <u>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා අදාළ ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා**</u> | <u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u> <br><br> රජයට අය කර ගත හැකි රාජ්‍ය ආදායමෙන් මේ වන විට අයකර ගනු ලබනුයේ 1/3 ක ප්‍රමාණයක් බවත්, 2/3 ක ආදායමක් අය කර ගැනීමට නොහැකි වී ඇති බවත් පෙන්වා දුන් කාරක සභාව, එකතු කළ හැකි සම්පූර්ණ රාජ්‍ය ආදායම අය කර ගත හැකි ප්‍රායෝගික වැඩපිළිවෙළක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සකස් කළ යුතු බව අවධාරණය කළේය. <br><br> එසේම, රාජ්‍ය ආදායමෙන් වැඩිම ප්‍රතිශතයක් සඳහා දායකත්වය සපයනු ලබන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණයේ දුර්වලතා ඇති බව කාරක සභාව විසින් දිගින් දිගටම පෙන්වා දෙනු ලැබූ අතර, මෙම ආයතන තුන හරහා උපයා ගනු ලබන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> - කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට වෙන් වූ ඒකකයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ පිහිටුවීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදි. |
| 07 | <u>ශ්‍රී ලංකා රේගු සංශෝධන පනත් කෙටුම්පත</u> <br><br> ශ්‍රී ලංකා රේගු ආඥා පනතට සිදු කරනු ලබන සංශෝධන පිළිබඳ කාරක සභාව විමසීය. | • භාණ්ඩ වල මිල ඌන තක්සේරු කර (under Value) භාණ්ඩ ආනයනය කර ඒ බව අනාවරණය වූ අවස්ථාවකදී නියම ලෙස ගෙවිය යුතු ඉතිරි බදු මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර වෙන බවත්; සහ <br> • රේගු ආඥා පනත යටතේ වංචනිකව කරනු ලබන ආනයනයන් සඳහා විමර්ශනයකින් අනතුරුව අයකර ගනු ලබන දඩ මුදල්වලින් 50% රජයේ ඒකාබද්ධ අරමුදලට ද , 5% ක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදලට ද සහ 45% ශ්‍රී ලංකා රේගුවේ ත්‍යාග අරමුදල වෙත බැර වෙන පරිදි සහ රජයේ ආයතනයක් විසින් භාණ්ඩ ආනයනය කිරීමේ දී රේගු ආඥා පනත යටතේ වංචනික ක්‍රියාවක් සඳහා ගෙවිය යුතු දඩ මුදල්, රජයට අයවිය යුතු බදු මුදල් ඇති විට එම මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර වෙන පරිදි රේගු ආඥා පනතට සංශෝධන යෝජනා කර ඇති බවත්, <br> • මෙම කටයුතු ජුනි මාසය තුළ අවසන් කිරීමට නියමිත බවත්, <br><br> මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | - ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>- කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 08 | **<u>ශ්‍රී ලංකා රේගුවේ සේවය කරන වාප්පු ලිපිකරුවන්ගේ (wharf clerk) සේවය ලබා ගැනීම සම්බන්ධ නෛතික ප්‍රතිපාදන සංශෝධනය කිරීම</u>** | • ලෝකයේ අනෙකුත් රටවල ද වාප්පු ලිපිකරුවන් (wharf clerk) සේවය කරනු ලබන බව සහ ලෝක රේගු සංවිධානය විසින් ද මෙම තනතුර පිළිගෙන ඇති බවත්;<br>• භාණ්ඩ ආනයනයේ දී රේගුවට ඉදිරිපත් කළ යුතු ලේඛන පිළියෙල කිරීම මොවුන් විසින් සිදු කරනු ලබන බවත්; සහ<br>• එය තාක්ෂණික කර්තව්‍යයක් බැවින් ඒ සඳහා පුහුණුව ලැබූ ඔවුන්ගේ සේවාව ආනයනකරුවන් වෙත අවශ්‍ය බවත්,<br>මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>කෙසේ නමුත් මොවුන්ගේ සේවාව පිළිබඳවත්, ඒ සම්බන්ධ වංචනික ක්‍රියා සහ ඒකාධිකාරයක් ඇති වීම වළක්වා ගැනීම සඳහාත් එක් එක් වාප්පු ලිපිකරු විසින් ඉටු කරනු ලබන රාජකාරී පිළිබඳ අධීක්ෂණය කිරීම හා වැඩ බෙදී යාම පිළිබඳව සතියකට/මසකට වරක් හෝ සොයා බැලීම වැදගත් බවත් කාරක සභාව අවධාරණය කළේය. |
